# संस्कृतभाषा

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මූලික පිරිවෙන

4

ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Scanned by CamScanner

# සංස්කෘත භාෂාව

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

# 4 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


පිරිවෙන් ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**

විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**

විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**



**මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

**සංස්කෘත භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

4 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0506-5

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

## පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනාගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙ මගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගුරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412’5’12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පන්ති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්තිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්‍ෂ ජනරාල්,<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>විජිත වෙලගෙදර, අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **අධීක්‍ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්‍ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |

**විෂය විශේෂඥ උපදේශනය** :

මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය** :

පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය උළුවිටිකේ සෝමරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
ගා/පියරතන මූලික පිරිවෙණ, බෝපේ, ගාල්ල

පූජ්‍ය බෝගහපිටියේ ධර්ම ශ්‍රී ඥාණ හිමි
පරිවේණාචාර්ය, ගම්/විද්‍යාවංශ මහ පිරිවෙණ
බණ්ඩාරවත්ත, ගම්පහ

බී. සී. කේ. කුමාර
පරිවේණාචාර්ය, මාර/ ශ්‍රී ඉසිපතන මූලික පිරිවෙණ
කිරින්ද, පුහුල්වැල්ල

නදී අමා ජයසේකර
ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, විභාග දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**භාෂා හා විෂය කරුණු සංස්කරණය** :

පූජ්‍ය නිග්ගහ ඤාණින්ද හිමි
කථිකාචාර්ය, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලය
අවිස්සාවෙල්ල

මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)
භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**සෝදුපත් කියැවීම** : පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් සැකැසීම** : පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය හසලක සෝමරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
කො/ විද්‍යාලංකාර මහ පිරිවෙණ, පන්නිපිටිය

පූජ්‍ය මාර්තුපිටියේ මෙත්තාරාම හිමි
ගුරු උපදේශක, කළු/ ශ්‍රී ධම්මරතන මූලික පිරිවෙණ,
හොරණ

පූජ්‍ය මීගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති, ගම්/ ශ්‍රී ධීරානන්ද විද්‍යායතන
පිරිවෙණ, තැඹිලිගස්මුල්ල, මාකොළ

එච්. එම්. ජයන්ත හේරත්
පරිවේණාචාර්ය, මාර/ශ්‍රී රතනපාල මහ පිරිවෙණ
කොටුව, මිගදාය, මාතර

**පිටකවර නිර්මාණය** : ජේ. එම්. තරිඳු හසංග
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විවිධ සහාය** : පී. ජී. බී. බුද්ධිකා
රාජ්‍ය කළමනාකරණ සහකාර

## ගුරුමාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දි ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදාගැනීමට ප්‍රබල සටනක් ගෙනගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම් ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළබසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘතභාෂා අධ්‍යයනය අන් කිසිවකුටත්

වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මූලික පිරිවෙන් තුළ වඩාත් ඵලදායී ව සහ සුගම ව සංස්කෘත භාෂාව ඉගැන්වීමේ උදාර අරමුණෙන් මෙම ගුරු මර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, සහ ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම, මේ තුළින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වනු ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබ ගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබට මේ වන විටත් හොඳ අවබෝධයක් ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2019 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නො විය යුතු වේ. ඔබ ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

මූලික පිරිවෙන් සංස්කෘත විෂය නිර්දේශය සමස්ත වශයෙන් නිපුණතා 10ක් ඔස්සේ විස්තාරණය වී ඇති අතර ඒ අතුරින් පළමු වන ශ්‍රේණිය සඳහා නිපුණතා 05ක් ද, දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා 06ක් ද, තෙවන, සිව් වන, පස් වන ශ්‍රේණිවල දී සමස්ත නිපුණතා 10 ම ද, වශයෙන් සිරස් ව ගැඹුරටත්, තිරස් ව පුළුල් වත්, විහිදේ. අනතුරු ව එම නිපුණතාවලින් නියමිත ශ්‍රේණියේ දී සාක්ෂාත් කර ගත යුතු යැ යි අපේක්ෂිත කොටස නිපුණතා මට්ටම් ලෙස දක්වා එහි සීමා නිශ්චය කරමින් ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත. ඊට අදාළ විෂය සන්ධාරය තීරණය කර ඇත්තේ එම ඉගෙනුම් පල පදනම් කර ගන්මිනි.

ගුරුවරයාට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු කාර්යභාරය දැක්වීමට ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර ඇත. එ මගින් ගුරුවරයා අවශ්‍ය ඉලක්කය කරා දිශාභිමුඛ කෙරෙන අතර කාලච්ඡේදවල දී සුදුසු පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය කිරීමට හැකි වන සේ පාඩම් සැලැසුම් සකසා ගැනීම ගුරු අභිමතය පරිදි කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කර ගැනීමෙන් පසු සිසුන්ට අත්පත් කර ගැනීමට හැකි වූ ඉගෙනුම් පල ප්‍රමාණය තක්සේරු කර බැලීම ද නිපුණතාවක් හෝ ඒකකයක් හෝ අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලි ක්‍රමයක් හා ගුණාත්මක යෙදවුම් ද භාවිත කිරීමට ගුරුවරයාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය.

මෙම ගුරුමාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ගුරුමාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

**පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති,
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය,
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| ජාතික අරමුණු | xvi |
| මූලික නිපුණතා | xvii |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xx |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxi |
| විෂය නිර්දේශය | xxiii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxiii |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | |
| පාඩම 1 - දේවනාගරී අක්‍ෂරමාලාව - ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද | 3 |
| පාඩම 2 - දේවනාගරී අක්‍ෂරමාලාව - වෙනත් භාෂා සමග සංසන්දනය | 6 |
| පාඩම 3 - දේවනාගරී අක්‍ෂරමාලාව - ප්‍රත්‍යාහාර ක්‍රමය | 8 |
| පාඩම 4 - නාමපද | 12 |
| පාඩම 5 - ආඛ්‍යාතපද | 23 |
| පාඩම 6 - සන්ධි (ව්‍යඤ්ජනසන්ධිය) | 26 |
| පාඩම 7 - සන්ධි (අනුස්වාරසන්ධිය) | 32 |
| පාඩම 8 - සමාස | 35 |
| පාඩම 9 - තද්ධිත | 39 |
| පාඩම 10 - කෘදන්ත | 49 |
| පාඩම 11 - වාක්‍යනිර්මාණය | 51 |
| පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - ප්‍රථමාදර්ශය | 58 |
| පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - චාණක්‍යශතකය | 60 |
| පාඩම 14 - පඤ්චතන්ත්‍රය | 63 |
| ඇගයීම හා තක්සේරුකරණය | 66 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවයශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම

තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවනරටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යොතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍යරසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධශ්ලෝක මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබා දීම

## සංස්කෘත භාෂාව
## විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 04 | I | 1.1, 1.2, 1.3, 2.1, 3.1, 9.1, 10.1, 10.2 | 59 |
| | II | 3.1, 4.1, 4.2, 5.1, 9.1, 10.1, 10.2 | 58 |
| | III | 6.1, 7.1, 8.1, 9.1, 10.1, 10.2 | 58 |
| | | එකතුව | 175 |

# संस्कृतपाठ्यक्रमः

සංස්කෘත විෂය නිර්දේශය

## 4 ශ්‍රේණිය

आचार्यात् पादमादत्ते - पादः शिष्यः स्वमेधया ।
पादः सब्रह्मचारिभ्यः - पादः कालक्रमेण च ॥

ඉගෙනීම කොටස් සතරක් නම්, එක් කොටසක් ගුරුවරයාගෙන් ද, එක් කොටසක් ස්වබුද්ධියෙන් ද, එක් කොටසක් එක් ව වාසය කරන්නන්ගෙන් ද, ඉතිරි කොටස කාලයාගේ ඇවෑමෙන් ද, ලැබෙන්නේ ය.

# වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| ශ්‍රේණිය / නිපුණතාව | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | **110** |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 01 | 01 | 02 | **90** |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | **95** |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | **105** |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | |
| නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | **197** |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | |
| සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | **47** |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | **130** |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | |
| **එකතුව** | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.** | 1.1 සාරස්වතය ඇසුරින් දේවනාගරී අක්ෂරමාලාවේ ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද අධ්‍යයනය කරයි. | 1.1 සාරස්වතය<br>• ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද | 1.1<br>• දේවනාගරී හෝඩියේ සම්පූර්ණ අක්ෂරමාලාව අනුපිළිවෙළට මතකයෙන් ප්‍රකාශ කරයි.<br>• සාරස්වතසූත්‍ර උපයෝගී කර ගනිමින් දේවනාගරී අක්ෂරමාලාව ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජන ප්‍රභේදවලට වෙන් කර පෙන්වයි. | 15 |
| | 1.2 දේවනාගරී අක්ෂරමාලාව වෙනත් භාෂාවල අක්ෂරමාලා සමග සංසන්දනය කරයි. | 1.2 දේවනාගරී අක්ෂරමාලාව, සිංහල භාෂාවේ සහ පාලි භාෂාවේ අක්ෂරමාලා සමග සංසන්දනය කරයි.<br>• අක්ෂරරූප<br>• අක්ෂරසංඛ්‍යාව<br>• අක්ෂරහඬ<br>• අක්ෂරවර්ග | 1.2<br>• සංස්කෘත, සිංහල සහ පාලි භාෂාවල අක්ෂරමාලා විවිධත්වය වගුගත කිරීමෙන් ඉස්මතුකොට පෙන්වයි.<br>• ඕනෑ ම සංස්කෘත ලේඛනයක් ඉදිරිපත් කළ විට එහි ඇති අක්ෂර එකිනෙක නිවැරදි ව වර්ග කරයි. | |
| | 1.3 ප්‍රත්‍යාහාර ක්‍රමය භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 1.3 දේවනාගරී අක්ෂරමාලාවේ ව්‍යඤ්ජනාක්ෂර ප්‍රත්‍යාහාර ක්‍රමය අනුව වෙන් කිරීම | 1.3<br>• නම් කරනු ලබන ප්‍රත්‍යාහාරයකට අනුකූල ව අක්ෂර උපුටා දක්වයි.<br>• සංයුක්තාක්ෂරවල විශේෂ අවස්ථා පහදයි. | |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.** | 2.1 විභක්තිවලට අනුව නාම වරනගයි. | 2.1 ස්වරාන්ත, හලන්ත සහ විභක්ති අට<br>• ස්වරාන්ත සහ හලන්ත<br>• විභක්ති<br>  • ප්‍රථමා<br>  • සම්බෝධන<br>  • ද්විතීයා<br>  • තෘතීයා<br>  • චතුර්ථී<br>  • පඤ්චමී<br>  • ෂෂ්ඨී<br>  • සප්තමී | 2.1<br>• ස්වරයකින් අවසන් වන නාම ස්වරාන්ත ලෙස නම් කරයි.<br>• සංස්කෘත භාෂාවේ නාමවිභක්ති අටක් යටතේ වරනැගෙන බව ප්‍රකාශ කරයි.<br>• නාමවිභක්ති අට නම් කරයි.<br>• නාමවිභක්තිවල අර්ථ පහදයි.<br>• දෙනු ලබන අනෙකුත් ඕනෑ ම පුංලිඞ්ග ශබ්දයක් අනුපිළිවෙළට වරනගයි.<br>• දෙනු ලබන අනෙකුත් ඕනෑ ම ස්ත්‍රීලිඞ්ග ශබ්දයක් අනුපිළිවෙළට වරනගයි.<br>• දෙනු ලබන අනෙකුත් ඕනෑ ම නපුංසකලිඞ්ග ශබ්දයක් අනුපිළිවෙළට වරනගයි.<br>• ව්‍යඤ්ජනයකින් අවසන් වන නාම හලන්ත ලෙස නම් කරයි.<br>• නකාරාන්ත පුංලිඞ්ග 'රාජන්' ශබ්දය, දකාරාන්ත පුංලිඞ්ග 'ද්විපාද්' ශබ්දය, තකාරාන්ත පුංලිඞ්ග 'මරුත්' ශබ්දය සහ සකාරාන්ත පුංලිඞ්ග 'පුංස්' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• චකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'වාච්' ශබ්දය, තකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'සරිත්' ශබ්දය, ධකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'සමිධ්' ශබ්දය සහ දකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'සම්පද්' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.<br>• කකාරාන්ත නපුංසකලිඞ්ග 'සර්වශක්' ශබ්දය, චකාරාන්ත නපුංසකලිඞ්ග 'සුවාච්' ශබ්දය සහ ජකාරාන්ත නපුංසකලිඞ්ග 'අසෘජ්' ශබ්දය අනුපිළිවෙළට වරනගයි. | 15 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි. | 3.1 ලට්, ලඞ්, ලෝට් සහ විධිලිඞ් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි නිවැරදි ව භාවිත කරයි. | 3.1 ලට්, ලඞ්, ලෝට් සහ විධිලිඞ් යන ලකාර, උභය පදයෙහි වරනැඟීම<br>• පරස්මෛපද ප්‍රත්‍යය<br>• ආත්මනෙපද ප්‍රත්‍යය | 3.1<br>• ලියනු ලබන සරල වාක්‍යයන්හි ආඛ්‍යාතපදවල ඇති ලට්, ලඞ්, ලෝට් සහ විධිලිඞ් පරස්මෛපද ප්‍රත්‍ය වෙන්කොට දක්වයි.<br>• ලියනු ලබන සරල වාක්‍යයන්හි ආඛ්‍යාතපදවල ඇති ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් ආත්මනේපද ප්‍රත්‍ය වෙන්කොට දක්වයි.<br>• දෙනු ලබන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් ආඛ්‍යාතපද යෝජනා කරයි.<br>• ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් යන ලකාර හතරෙහි උභයපදයට අදාළ ව ඕනෑ ම ආඛ්‍යාතපදයක් වරනගයි. | 15 |
| 4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි. | 4.1 ව්‍යඤ්ජන සන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.1 ව්‍යඤ්ජනසන්ධිය<br>• ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේද<br>  • ලෝපසන්ධිය<br>  • ආදේශසන්ධිය<br>  • ආගමසන්ධිය<br>  • ද්විත්වසන්ධිය<br>• නිර්දිෂ්ටපාඨ ඇසුරින් ව්‍යඤ්ජන සන්ධිපද විසන්ධි කිරීම හා විසන්ධිපද සන්ධි කිරීම | 4.1<br>• ව්‍යඤ්ජනසන්ධිය සහිත වචන නම් කරයි.<br>• ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේද නම් කරයි.<br>• ව්‍යඤ්ජනසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන්කොට පෙන්වයි.<br>• ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.<br>• ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ව්‍යඤ්ජනසන්ධිය සහිත පද උපුටා දක්වයි.<br>• ව්‍යඤ්ජනසන්ධිපද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතුකර පෙන්වයි. | 12 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 අනුස්වාර සන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.2 අනුස්වාරසන්ධිය<br>• වර්ගාන්තාදේශ සන්ධිය<br>• පරරූපසන්ධිය<br>• නිර්දිෂ්ටපාඨ ඇසුරින් අනුස්වාර සන්ධිපද විසන්ධි කිරීම හා විසන්ධිපද සන්ධි කිරීම | 4.2<br>• අනුස්වාරසන්ධිය සහිත වචන නම් කරයි.<br>• අනුස්වාරසන්ධි ප්‍රභේද නම් කරයි.<br>• අනුස්වාරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කර පෙන්වයි.<br>• අනුස්වාරසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.<br>• අනුස්වාරසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනුස්වාරසන්ධිය සහිත පද උපුටා දක්වයි.<br>• අනුස්වාර සන්ධිපද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතු කර පෙන්වයි. | |
| **5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.** | 5.1 සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි. | 5.1 සමාසවර්ග<br>• අව්‍යයීභාවසමාසය<br>• තත්පුරුෂසමාසය<br>• ද්විතීයාතත්පුරුෂය<br>• තෘතීයාතත්පුරුෂය<br>• චතුර්ථීතත්පුරුෂය<br>• පඤ්චමීතත්පුරුෂය<br>• ෂෂ්ඨීතත්පුරුෂය<br>• සප්තමීතත්පුරුෂය<br>• ද්වන්ද්වසමාසය<br>• සමාහාරද්වන්ද්ව<br>• ඉතරේතරයෝග ද්වන්ද්ව<br>(අනෙකුත් සමාස ඉගැන්වීම අපේක්ෂා නො කෙරේ.) | 5.1<br>• අව්‍යයීභාවසමාසය හඳුන්වයි.<br>• අව්‍යයීභාව සමාසපද නම් කරයි.<br>• අව්‍යයීභාව සමාසප්‍රභේද නම් කරයි.<br>• අව්‍යයීභාව සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අව්‍යයීභාව සමාසපද උපුටා දක්වයි.<br>• තත්පුරුෂ සමාසය හඳුන්වයි.<br>• තත්පුරුෂ සමාසපද නම් කරයි.<br>• තත්පුරුෂ සමාසප්‍රභේද නම් කරයි.<br>• තත්පුරුෂ සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල පාඨවලින් තත්පුරුෂ සමාසපද උපුටා දක්වයි. | 12 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • ද්වන්ද්ව සමාසය හඳුන්වයි.<br>• ද්වන්ද්ව සමාසපද නම් කරයි.<br>• ද්වන්ද්ව සමාසප්‍රභේද නම් කරයි.<br>• ද්වන්ද්ව සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ද්වන්ද්ව සමාසපද උපුටා දක්වයි. | |
| **6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.** | 6.1 තද්ධිතපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 6.1 තද්ධිතවර්ග<br>• අපත්‍යතද්ධිත<br>• භාවතද්ධිත<br>• අස්ත්‍යර්ථතද්ධිත<br>• සමූහාර්ථතද්ධිත<br><br>(අනෙකුත් තද්ධිතවර්ග ඉගැන්වීම අපේක්ෂා නො කෙරේ.) | 6.1<br>• අපත්‍යතද්ධිතය හඳුන්වයි.<br>• අපත්‍ය තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අපත්‍ය තද්ධිතපද උපුටා දක්වයි.<br>• භාවතද්ධිතය හඳුන්වයි.<br>• භාවතද්ධිත පද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් භාව තද්ධිතපද උපුටා දක්වයි.<br>• අස්ත්‍යර්ථ තද්ධිතය හඳුන්වයි.<br>• අස්ත්‍යර්ථ තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ට ග්‍රන්ථවල පාඨවලින් අස්ත්‍යර්ථ තද්ධිතපද උපුටා දක්වයි.<br>• සමූහාර්ථ තද්ධිතය හඳුන්වයි.<br>• සමූහාර්ථ තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් සමූහාර්ථ තද්ධිතපද උපුටා දක්වයි. | 12 |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.** | 7.1 ත්‍රෛකාලික කෘදන්ත නිවැරදි ව භාවිත කරයි. | 7.1 ත්‍රෛකාලිකකෘදන්ත<br>• කෘදන්තවල ප්‍රත්‍ය 24 ක්<br>  • තෘ, අක, ක, අ, අන, ණිනි, ශ, ණ, ඩ, ට, ඉ, බ, බි, බස්, බ්‍යුට්, විවි, ඩාවි, ටක්, විණ්, මනිප්, ක්වනිප්, වනිප්, ක්විප්, කෙලිම | 7.1<br>• ත්‍රෛකාලිකකෘදන්ත හඳුන්වයි.<br>• ත්‍රෛකාලිකකෘදන්තවල ප්‍රත්‍ය 24 වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.<br>• ප්‍රත්‍ය 24ට අදාළ ත්‍රෛකාලික කෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ත්‍රෛකාලික කෘදන්ත පද උපුටා දක්වයි. | 12 |
| **8.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.** | 8.1 සම්බන්ධීකාරක පද සහ ප්‍රශ්නවාචීපද සහිත පූර්ණ වාක්‍ය ගොඩනගයි. | 8.1 සම්බන්ධීකාරක පද සහිත වාක්‍ය<br>• තථාපි, යද්‍යපි, චේත් යනාදි අනෙකුත් සම්බන්ධීකාරකපද | 8.1<br>• සම්බන්ධීකාරකපද හඳුන්වයි.<br>• සම්බන්ධීකාරකපද ගොනු කරයි.<br>• සම්බන්ධීකාරකපද යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කර ප්‍රකාශ කරයි; ලියයි.<br>• ඡේදයක ඇති සම්බන්ධීකාරක පද සහිත වාක්‍ය උපුටා දක්වයි.<br>• සම්බන්ධීකාරකපද සහිත වාක්‍ය පරිවර්තනය කරයි. | 10 |
| | | 8.2 ප්‍රශ්නවාචී පද සහිත වාක්‍ය<br>• කිම්, කදා, කිමර්ථම්, කඃ, කා, කෙ, කිම්, කදා, යනාදි අනෙකුත් ප්‍රශ්නවාචීපද | 8.2<br>• ප්‍රශ්නවාචීපද හඳුන්වයි.<br>• සම්බන්ධීකාරකපද ගොනු කරයි.<br>• ප්‍රශ්නවාචීපද යොදා ගනිමින් වාක්‍යනිර්මාණය කර ප්‍රකාශ කරයි; ලියයි.<br>• ඡේදයක ඇති ප්‍රශ්නවාචීපද සහිත වාක්‍ය උපුටා දක්වයි. | |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **9.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.** | 9.1 ප්‍රථමාදර්ශය අර්ථාන්විත ව පරිශීලනය කරයි. | • **ප්‍රථමාදර්ශය - (16 - 30)** කියවීම හා පරිවර්තනය කිරීම | 9.1<br>• ප්‍රථමාදර්ශය - (16 - 30) ගද්‍ය සහ පද්‍ය (ශ්ලෝක) කියවයි.<br>• අර්ථය මව්බසට පරිවර්තනය කරයි.<br>• සංස්කෘත භාෂාවෙන් විමසන ප්‍රශ්නවලට සංස්කෘත භාෂාවෙන් ම පිළිතුරු සපයයි. | 47 |
| | 9.2 චාණක්‍යශතකය අර්ථාන්විත ව පරිශීලනය කරයි. | 9.2 චාණක්‍යශතකයෙන් උපුටා ගන්නා ලද ශ්ලෝක<br>• 4, 7, 11, 12, 13, 14, 16, 17, 20, 21, 23, 24, 26, 34, 35, 40, 44, 46, 47, 57, 60, 68, 73, 76, 84, 85, 92, 93, 102, 105 | 9.2<br>• චාණක්‍යශතකයේ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• චාණක්‍යශතකයේ ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.<br>• චාණක්‍යශතකයේ ශ්ලෝක රසවිඳියි. | |

# 4 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි.** | 10.0 පඤ්චතන්ත්‍රය රසවිඳියි. | 10.1 පඤ්චතන්ත්‍රයේ කථා<br>• කථාව (අංක 01) කීලෝත්පාටීවානරකථා<br>• කථාව (අංක 07) බකකර්ටකකථා<br>• කථාව (අංක 14) මත්ස්‍යත්‍රයකථා<br>• කථාව (අංක 17) සූචීමුඛ-වානරයූථකථා<br>• කථාව (අංක 18) වානර-චටකදම්පතිකථා<br>• කථාව (අංක 19) ධර්මබුද්ධි-පාපබුද්ධිකථා<br>• කථාව (අංක 22) නෘපසේවකවානරකථා<br>පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක<br>• 3, 5, 7, 19, 76, 78, 111, 114, 118, 130, 139, 145, 148, 149, 159, 174, 176, 188, 210, 211, 212, 213, 225, 260, 280, 288, 395, 425, 426, 427 | 10.1<br>• පඤ්චතන්ත්‍රයේ කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• පඤ්චතන්ත්‍රයේ කථා මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.<br>• පඤ්චතන්ත්‍රයේ කථා රසවිඳියි.<br>• පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.<br>• පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක රසවිඳියි. | 25 |

## නිර්දිෂ්ටග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (4 ශ්‍රේණිය)

### 1. නිර්දිෂ්ටග්‍රන්ථ


- සංස්කෘත භාෂාව - 04, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- සංස්කෘත ප්‍රථමාදර්ශය, 16 - 30 පාඩම්, විද්‍යාසාගර කේ. එල්. වී. ශාස්ත්‍රී, ආර්. එස්. වෛද්‍යාර් සහ පුත්‍රයෝ, ඉන්දියාව - 2010
- සංස්කෘත පාඨමාලා - 04, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, විද්‍යාලංකාර මුද්‍රණාලය, පැලියගොඩ, 2016
- සාරස්වතව්‍යාකරණම් (දේවනාගරී) ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, උදය ග්‍රැපික්ස්, රත්තණපිටිය - 2016


### 2. පරිශීලනීය ග්‍රන්ථ


- සරල සංස්කෘත ශික්‍ෂකය - 01, බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ - 2012
- කිං සංස්කෘත භාෂයා රචනාං ලිඛාමඃ - පූජ්‍ය උඩවෙල රේවත හිමි, ආචාර්ය කේ. බී. ජයවර්ධන, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2012
- ගීත කෞමුදී (සංයුක්ත තැටිය සහිත ව), පූජ්‍ය උඩවෙල රේවත හිමි - 2011
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය මරදාන - 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග), පූජ්‍ය හැගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නො කොට පිරිවෙන් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දක්වේ.

01. සංස්කෘත භාෂා දින
02. කණ්ඩායම් සංවාද
03. මාසික වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, සජ්ඣායනය
04. සංස්කෘත භාෂාව පසුබිම් කර ගත් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, පුරා විද්‍යාව, ආයුර්වේදය වැනි තේමා පිළිබඳ ගවේෂණ
05. බිත්ති පුවත්පත් පළ කිරීම
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම
08. දේවනාගරී අක්ෂර යොදා ගනිමින් විවිධ තොරතුරු සන්නිවේදනය සඳහා පෝස්ටර් නිර්මාණය

## තක්සේරු හා ඇගැයීම් කාර්යය

**පාසල පදනම් කරගත් ඇගයීම්** වැඩපිළිවෙළ පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගැනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගැනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගැනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැ යි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල් ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල් ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. '**සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා**' ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන් ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නො වුව ද විෂමතා හඳුනා ගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලී විෂයයක් බවට පත් කිරීමටත්, එම විෂය ඉගැනීම සඳහා ඔවුන් පෙළඹවීමටත්, භාෂාව පහසුවෙන් ඉගැනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නො ඉක්මවමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සකස් කළ යුතු ය. එ විට පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කෙරේ.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය (Transmisson Role), ගනුදෙනු ක්‍රමය (Transaction Role), ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role). ගුරුවරයා අනුගමනය කරනු ඇතැ යි මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයකු ගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඉගැනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නො හැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන් ගේ ඉගැනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයා ගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂයය සමස්ත පිරිවෙන් පද්ධතියේ ප්‍රධාන සහ අනිවාර්ය භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගැනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

# පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව - ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 සාරස්වතය ඇසුරින් දේවනාගරී අක්ෂරමාලාවේ ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේද අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :

- දේවනාගරී හෝඩියේ සම්පූර්ණ අක්ෂරමාලාව අනුපිළිවෙළට මතකයෙන් ප්‍රකාශ කරයි.
- සාරස්වතසූත්‍ර උපයෝග කර ගනිමින් දේවනාගරී අක්ෂරමාලාව ස්වරප්‍රභේද සහ ව්‍යඤ්ජනප්‍රභේදවලට වෙන් කර පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- සාරස්වතයේ ඇති පහත සඳහන් ශ්ලෝකය ඇසීමට සලස්වා එහි අර්ථය පහදා දෙන්න.
  **एकमात्रो भवेद्ध्रस्वो द्विमात्रो दीर्घ उच्यते ।**
  **त्रिमात्रस्तु प्लुतो ज्ञेयो व्यञ्जनञ्चार्धमात्रकम् ॥**

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

ස්වර

- සංස්කෘත භාෂාව 4 ශ්‍රේණිය පෙළ පොතෙහි පළමු වන පාඩමේ දේවනාගරී හෝඩිය සිසුන් සමග පිළිවෙළින් ශබ්ද නගා උච්චාරණය කරන්න.
- පෙළ පොතේ 3 හා 5 පිටුවලට සිසු අවධානය යොමු කරන්න.
- ස්වර, හ්‍රස්ව, දීර්ඝ, ප්ලුත, සන්ධ්‍යක්ෂර, නාමින්, අනාමින්, සමානාක්ෂර, ගුණ හා වෘද්ධි යනුවෙන් කොටස් නවයකට බෙදෙන ආකාරය පෙන්වන්න.
- හ්‍රස්ව යනු එක් මාත්‍රාවක් (කෙටි කාලයක්) තුළ උච්චාරණය කළ හැකි අකුරු බවත්, ගණනින් පහක් බවත් පෙන්වා දෙන්න.
- දීර්ඝ යනු මාත්‍රා දෙකක කාලයක් තුළ උච්චාරණය වන අකුරු බවත්, ඒවා ගණනින් නවයක් බවත් පෙන්වන්න.
- **अचल, आभरण, इह, ईरण, उटज, ऊन, ऋण, ॠकार, ऌकार, एणक, ऐरावण, ओदन, औषध** යන වචන ප්‍රකාශ කර එහි ඇති හ්‍රස්ව හා දීර්ඝ අක්ෂර පෙන්වීමට සිසුන් යොමු කරන්න.

- මාත්‍රා දෙකකට වඩා වැඩි කාලයක් තුළ උච්චාරණය වන අකුරු ප්ලුත බවත්, ප්ලුතය ලියා පෙන්වීමට සංකේතරූප නොමැති බවත්,
    1. ගායනයේ දී,
    2. ඇඬීමේ දී,
    3. දුර සිටින අයකුට අඬගැසීමේ දී,
    4. යමක් යමෙකුගෙන් විචාරීමේ දී යන අවස්ථාවල දී, ප්ලුත යෙදෙන බවත් පහදන්න.
- ප්ලුත යෙදෙන (හැඬීම ආදි) අවස්ථාවන් හඬ නගා ප්‍රකාශ කරන්න.
- එවැනි තවත් අවස්ථා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සන්ධ්‍යක්ෂර යනු අක්ෂර දෙකක එකතුවෙන් සකස්වන අකුරක් බවත් **ए ऐ ओ औ सन्ध्यक्षराणि** යන සාරස්වතසූත්‍රය ඇසුරෙන් පහදා දෙන්න.
- සන්ධ්‍යක්ෂරවලින් ආරම්භ වන වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- නාමින් ස්වර යනු **अ आ** ස්වර දෙක හැර අනෙක් සියලු ම ස්වර බව **अवर्जा नामिनः** යන සාරස්වතසූත්‍රය උපයෝග කරගනිමින් පැහැදිලි කරන්න.
- නාමින් යෙදී ඇති වචන ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- අනාමින් යනු අක්ෂරමාලාවේ **अ आ** යන අක්ෂර දෙක බව පෙන්වා දෙන්න.
- එම අකුරුවලින් පටන් ගන්නා වචන ලිවීමට සිසුන් යොමු කරන්න.
- **अ इ उ ऋ ऌ** යන අකුරු සමානාක්ෂර බව **अ इ उ ऋ ऌ समानाः** යන සාරස්වතසූත්‍රය ඇසුරෙන් පහදන්න.
- **ए ओ अर् अल्** යනු ගුණ නම් වන බව **अरेदो नामिनो गुणाः** යන සාරස්වතසූත්‍රය ඇසුරින් පහදන්න.
- **आ ऐ औ आर् आल्** යනු වෘද්ධි නම් වන බව **आरैऔ वृद्धिः** යන සාරස්වතසූත්‍රය ඇසුරින් පහදන්න.
- ගුණ හා වෘද්ධි අක්ෂර සන්ධි, කෘදන්ත, තද්ධිත ආදි ව්‍යාකරණ අංගවල දී භාවිතයට ගැනෙන බවත්, ඒවායේ ඇති වැදගත්කමත් පෙන්වා දෙන්න.
- සංස්කෘත ස්වරමාලාවේ හ්‍රස්වස්වර එක් පාටකින් ද දීර්ඝස්වර වෙනත් පාටකින් ද හුණු පුවරුවෙහි ලියා හ්‍රස්ව හා දීර්ඝාක්ෂර සිසුන් සමග උච්චාරණය කරන්න. එහි ප්‍රභේද වෙන් වෙන් වශයෙන් පහදන්න.

## පියවර 2

**ව්‍යඤ්ජන**

- වර්ගාක්ෂර, අන්තඃස්ථ අක්ෂර, ඌෂ්මාක්ෂර, අනුස්වාර, විසර්ග, ඝෝෂාක්ෂර, අනුනාසික්‍ය අක්ෂර, අඝෝෂ අක්ෂර, අල්පප්‍රාණ අක්ෂර, මහාප්‍රාණාක්ෂර, වර්ගාන්තාක්ෂර යනුවෙන් කොටස් 11 කට බෙදෙන අයුරු පහදන්න.
- ව්‍යඤ්ජනවල **क** සිට **म** දක්වා **වර්ගාක්ෂර** අකුරු 25, **ස්පර්ශාක්ෂර** යනුවෙන් හඳුන්වන බව, **कादयो मावसानां स्पर्शाः / कुचुटुतुपु वर्गाः** යන සාරස්වතසූත්‍ර ඇසුරින් සාකච්ඡා කරන්න.

- **य व र ल** අකුරුවල ව්‍යඤ්ජනලක්‍ෂණ හා ස්වරලක්‍ෂණ ඇති බවත්, ඒවා අන්තඃස්ථ වශයෙන් හැඳින්වෙන බවත් **यरलवान्तस्थाः** යන සාරස්වතසූත්‍රය ඇසුරෙන් පහදන්න.
- අන්තඃස්ථ අකුරු ඇතුළත් වචන ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- ශබ්ද කරන විට උණුසුම් වායු ධාරාවක් පිටවන **श, ष, स, ह** යන අක්‍ෂර **හතර, ඌෂ්මාක්‍ෂර** බව **शषसह ऊष्मणाः** යන සාරස්වතසූත්‍රය ඇසුරින් පහදා දෙන්න.
- ඌෂ්මන් අකුරු ඇතුළත් වචන ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.
- අනුස්වාරය යනු බිංදුව බව **(अं) वर्णशिरो बिन्दुरनुस्वारः** යන සාරස්වතසූත්‍රය ඇසුරින් පහදන්න.
- විසර්ගය යනු උඩ, යට සිටින සේ බිංදු දෙක ඃ **(अः)** යන මෙම අකුර බවත්, එය ශබ්ද කරන විට මුවින් වායුව විශේෂයෙන් පිටවන බවත් පෙන්වා දී ඊට අදාළ **अः इति विसर्जनीयः** යන සාරස්වතසූත්‍රය හඳුන්වා දෙන්න.
- සෝෂාක්‍ෂර යනු **ग घ ङ ज झ ञ ड ढ ण द ध न ब भ म य व र ल ह** යන **අක්‍ෂර** 20 බවත් මෙම අක්ෂර උච්චාරණය කරන විට මහත් වූ ශබ්දයක් සහිත ව හඬ පිටවන බැවින් '**සෝෂාක්‍ෂර**' නමින් හැඳින්වෙන බව පහදන්න.
- අනුනාසික යනු වර්ගාක්‍ෂරවල අවසාන **අකුරු** 5 බවත්, ඒවා මුව හා නාසය උපයෝග කරගෙන උච්චාරණය කරන බැවින් අනුනාසිකාක්‍ෂර නමින් හැඳින්වෙන බවත් **मुखनासिकाभ्यामुच्छार्यमाणो वर्णोनुनासिकाः।** සාරස්වතසූත්‍රය උපයෝග කරගෙන සාකච්ඡා කරන්න.
- **අසෝෂාක්‍ෂර** යනු උච්චාරණය කරන විට අඩු ශබ්දයක් සහිත ව හඬ පිට වන **क ख च छ ट ठ त थ प फ श ष स** යන **අක්‍ෂර** 13 බව පෙන්වා දෙන්න.
- එම ප්‍රභේදවලට අදාළ ව සාරස්වතසූත්‍ර අර්ථ සහිත ව වනපොත් කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේවනාගරී අක්‍ෂරමාලාව අනුපිළිවෙළින් මතකයෙන් කීම
- **एकमात्रो भवेद्ध्रस्वो द्विमात्रो दीर्घ उच्यते।**
  **त्रिमात्रस्तु प्लुतो ज्ञेयो व्यञ्जनञ्चार्धमात्रकम्॥** යන ශ්ලෝකය හඬ නගා උච්චාරණය කිරීම
- දේවනාගරී අක්‍ෂරමාලාවේ ස්වරප්‍රභේද නවය පිළිවෙළින් විස්තර කිරීම
- දේවනාගරී අක්‍ෂරමාලාවේ ව්‍යඤ්ජනප්‍රභේද 11 පිළිවෙළින් විස්තර කිරීම
- වනපොත් කරන ලද සාරස්වතසූත්‍ර සජ්ඣායනා කිරීම
- ස්වර හා ව්‍යඤ්ජන නිවැරදි ව ව්‍යවහාර කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- සාරස්වතය

## පාඩම 2 - දේවනාගරී අක්ෂරමාලාව - වෙනත් භාෂා සමග සංසන්දනය

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 දේවනාගරී අක්ෂරමාලාව වෙනත් භාෂාවල අක්ෂරමාලා සමග සංසන්දනය කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘත, සිංහල සහ පාලි භාෂාවල අක්ෂරමාලා විවිධත්වය වගුගත කිරීමෙන් ඉස්මතුකොට පෙන්වයි.
- ඕනෑ ම සංස්කෘත ලේඛනයක් ඉදිරිපත් කළ විට එහි ඇති අක්ෂර එකිනෙක නිවැරදි ව වර්ග කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- පෙළපොතේ ඇති සංස්කෘත, පාලි, සිංහල යන භාෂාවලට අයත් වගුවල අක්ෂර සිසුන් සමග නිවැරදි ව උච්චාරණය කරන්න.
- ඒවා එකිනෙක සංසන්දනය කොට පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

- දේවනාගරී අක්ෂරමාලාව, සිංහල අක්ෂරමාලාව සහ පාලි අක්ෂරමාලාව නිවැරදි ව ශබ්ද නගා උච්චාරණය කරන්න.
- දේවනාගරී අක්ෂරමාලාවේ හා සිංහල අක්ෂරමාලාවේ ස්වර හා ව්‍යඤ්ජන එකිනෙක ගළපන්න.
- දේවනාගරී අක්ෂරමාලාව සහ පාලි අක්ෂරමාලාව එකිනෙක ගළපන්න.
- එම එක් එක් අක්ෂරමාලාවේ සමාන හා අසමාන අක්ෂර වෙන් කොට හුණු පුවරුවේ ලියා ශබ්ද නගා උච්චාරණය කරන්න.
- පාලි, සිංහල, සංස්කෘත යන භාෂාවල අක්ෂර රූපමය වශයෙන් වෙනස් වුව ද ශබ්දමය වශයෙන් උච්චාරණයේ දී සමාන වන බව වටහා දෙන්න.
- එම එක් එක් අක්ෂරවල හැඩයේ සමාන සහ අසමාන, විවිධතා ද සාකච්ඡා කර සිසුන් ලවා හුණු පුවරුවේ ලියවන්න.
- සංස්කෘත අක්ෂරමාලාවේ ස්වර 14ක් ද, ව්‍යඤ්ජන 35ක් ද, පාලි අක්ෂරමාලාවේ ස්වර 8ක් ද, ව්‍යඤ්ජන 33ක් ද, සිංහල අක්ෂරමාලාවේ ස්වර 18ක් ද, ව්‍යඤ්ජන 42ක් ද, ඇති බව අවධාරණය කරන්න.

- පෙළපොතෙහි ඇති වගු යොදා ගනිමින් සිංහල අක්ෂරමාලාවේ ඇති ඇ, ඈ, එ, ඔ යන ස්වර දේවනාගරී අක්ෂරමාලාවේ ඇතුළත් නොවන බව පැහැදිලි කරන්න.
- පෙළපොතෙහි ඇති වගු යොදා ගනිමින් සිංහල අක්ෂර මාලාවේ ඇති ඇ, ඈ, ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ යන ස්වර පාලි අක්ෂරමාලාවේ ඇතුළත් නොවන බව පැහැදිලි කරන්න.
- සංස්කෘත, සිංහල, පාලි යන භාෂාවල ව්‍යඤ්ජන අකුරු සංසන්දනය කර පහත කරුණු ඉස්මතු වන සේ වගුගත කිරීමට සිසුන් යොමු කරන්න.

  - සිංහල භාෂාවේ ඇති සඤ්ඤක අක්ෂර ඟ, ඦ, ඬ, ඳ, ඹ දේවනාගරී අක්ෂරමාලාවේ ඇතුළත් නො වේ.

  - ඌෂ්මන් ෆ අක්ෂරය හා අන්තඃස්ථ ළ අක්ෂරය නාගරී අක්ෂරමාලාවේ ඇතුළත් නො වේ.
- අභිනවා පාඨාවලී ග්‍රන්ථයේ යෙදෙන අභිමත ඡේදයක් තෝරා ගනිමින් එහි ඇති දේවනාගරී අක්ෂර එකිනෙක වර්ග කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේවනාගරී, සිංහල සහ පාලි භාෂාවල අක්ෂරමාලාවේ ස්වර අක්ෂර වෙන් වෙන් වශයෙන් කියැවීම, ලිවීම
- දේවනාගරී, සිංහල සහ පාලි භාෂාවල අක්ෂරමාලාවේ ව්‍යඤ්ජන අක්ෂර වෙන් වෙන් වශයෙන් කියැවීම, ලිවීම
- එක් එක් වර්ණමාලාවල ඇති අක්ෂර විවිධතා ඉස්මතු වන සේ වගු නිර්මාණය කිරීම
- අක්ෂරමාලාවන්හි ඇති බොහෝ අක්ෂර හැඩයෙන් වෙනස් වුව ද උච්චාරණයෙන් සමාන බව තහවුරු කිරීම
- පාලි, සිංහල සහ සංස්කෘත යන අක්ෂරමාලාවල ස්වර හා ව්‍යඤ්ජන ප්‍රමාණ කර දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- අභිනවා පාඨාවලිය

# පාඩම 3 - දේවනාගරී අක්ෂරමාලාව - ප්‍රත්‍යාහාර ක්‍රමය

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.3 ප්‍රත්‍යාහාර ක්‍රමය භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- නම් කරනු ලබන ප්‍රත්‍යාහාරයකට අනුකූල ව අක්ෂර උපුටා දක්වයි.
- සංයුක්තාක්ෂරවල විශේෂ අවස්ථා පහදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- ඇමුණුම - 1හි ඇතුළත් ප්‍රත්‍යාහාර අක්ෂරමාලාව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒවා සිසුන් සමග හඬ නගා උච්චාරණය කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ප්‍රත්‍යාහාර යනු විද්‍යානුකූල අක්ෂර පෙළගැස්මක් බව සිසුන්ට පෙන්වා දෙන්න.
- ප්‍රත්‍යාහාර අක්ෂරමාලාවේ යම් අක්ෂර දෙකක් සඳහන් කිරීමෙන් ඒ අතරට ගැනෙන අක්ෂර ප්‍රත්‍යාහාර වශයෙන් නම් කරන බව ඇමුණුම 1 ඇසුරෙන් පෙන්වා දෙන්න.
- ඇමුණුම 1හි පරිදි දේවනාගරී ප්‍රත්‍යාහාර අක්ෂරමාලාවේ '**හල, ඤම, අබ, හස, චප**' යන ප්‍රත්‍යාහාර සිසුන් සමග ශබ්ද නගා කියවන්න.
- සාරස්වතයේ එන ප්‍රත්‍යාහාරසූත්‍රය වනපොත් කිරීමට සිසුන් මෙහෙයවන්න.
- අඟල් 4x4 ප්‍රමාණයේ කාඩ්පත් පහක් යොදා ගෙන '**හල, ඤම, අබ, හස, චප**' යන ප්‍රත්‍යාහාර ඇතුළත් කිරීමට සිසුන් යොමුකොට ඒවා හුවමාරු කරමින් කියවවන්න.
- නම් කරනු ලබන ප්‍රත්‍යාහාර ක්ෂණික ව අභ්‍යාස පොත්වල ලියා පෙන්වීමේ තරඟයකට සිසුන් යොමු කරන්න.

**පියවර 2**

- දේවනාගරී අක්ෂරමාලාවේ සංයුක්තාක්ෂර යනු ස්වර රහිත අක්ෂර දෙකෙක් හෝ වැඩි ගණනක් බැඳී නිර්මාණය වන අකුරු බව පෙන්වා දෙන්න.
- ඒවා ක්‍රම හතරකට ලිවිය හැකි බව සංස්කෘත භාෂාව පෙළපොත ඇසුරින් පෙන්වන්න.
- ඊට අනුකූල ව සංයුක්තාක්ෂර ලිවීමට හා කියැවීමට සිසුන් යොමු කරන්න.

- එකතුවීමේ දී විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර පෙළපොතේ දී ඇති වගුව පෙන්වමින් පහදන්න.
- විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර ඇතුළත් වචන එකතුවක් ගොනුකරන ලෙසට සිසුන්ට උපදෙස් දෙන්න.
- නිර්දේශිත පොත්වලින් ඒ එක් එක් ක්‍රමවලට අනුව සංයුක්ත වන බැඳි අකුරු ඇතුළත් තෝරාගත් ඡේද කිහිපයක් සිසුන් ලවා කියැවීමට හා කියවන විට ලිවීමට සලස්වන්න.
- ඇමුණුම 2 අභ්‍යාසය කිරීමට සිසුන් යොමු කරන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- ප්‍රත්‍යාහාර යන්න අර්ථ කථනය කිරීම
- **හල, ඤම, අබ, හස, චප'** ප්‍රත්‍යාහාරවල අක්ෂර වාචෝද්ගත ව ප්‍රකාශ කිරීම
- සංයුක්තාක්ෂර අර්ථ කථනය කිරීම
- විශේෂ රූප ගන්නා සංයුක්තාක්ෂර ගොනු කිරීම
- සංයුක්තාක්ෂර ලිවීම හා කියවීම

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම - 1 සහ 2
- අඟල් 4x4 ප්‍රමාණයේ කාඩ්පත්
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- නිර්දේශිතග්‍රන්ථ

# ප්‍රත්‍යාහාර අක්‍ෂරමාලාව

| ප්‍රත්‍යාහාර | | ප්‍රත්‍යාහාර නම් කිරීම | නම් කළ ප්‍රත්‍යාහාරයන්ට අයත් අකුරු |
|---|---|---|---|
| घोष | अ आ इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ ओ | අබ ප්‍රත්‍යාහාරය | සියලු ඝෝෂාක්‍ෂර (अ සිට ब දක්වා අකුරු) |
| | ह य व र ल | හල ප්‍රත්‍යාහාරය | ह य व र ल |
| | ञ ण न ङ म | ඤම ප්‍රත්‍යාහාරය | ञ ण न ङ म |
| | झ ढ ध घ भ | ඣභ ප්‍රත්‍යාහාරය | झ ढ ध घ भ |
| | ज ड द ग ब | ජබ ප්‍රත්‍යාහාරය | ज ड द ग ब |
| अघोष | ख फछ ठ थ | ඛස ප්‍රත්‍යාහාරය | ख फ छ ठ थ च ट त क प श ष स |
| | च ट त क प | ඛප ප්‍රත්‍යාහාරය | ख फ छ ठ थ च ट त क प |
| | श ष स -   आद्यन्ताभ्याम्। | චප ප්‍රත්‍යාහාරය | च ट त क प |
| * අකුරු දෙකක් සඳහන් කිරීමෙන් ඒ අතරට ගැනෙන අකුරු ප්‍රත්‍යාහාර නම් වේ. | | | |



01. (අ)
- **ह ल इ छ ग झ ठ** යන අකුරු අතුරින් **අඝෝෂාක්‍ෂර තෝරා** ලියන්න.
- **चप** ප්‍රත්‍යාහාරයට අයත් අක්‍ෂර ලියන්න.
- **ञम** ප්‍රත්‍යාහාරයට අයත් අක්‍ෂර ලියන්න.
- **ක්ත්‍ර, ද්ම, ශ්‍ර, ක්ත, ක්‍ෂ, ඥ, ද්‍ය, ශ්ච, ත්‍ර, ට්‍ර, ඪ්‍ර, ඨ, ඩ්‍ර** යන අකුරු යෙදෙන සංස්කෘත වචන ලියන්න.

(ආ) පහත සඳහන් සූත්‍රවල තේරුම ලියන්න.

१. **ञमे ञमा वा।**

..........................................................................................................

२. **कादयो मावसानाः स्पर्शाः।**

..........................................................................................................

३. ऋटुरषाणां मूर्धाः ।

........................................................................................................................

४. इचुयशानां तालु ।

........................................................................................................................

५. अरेदो नामिनो गुणाः ।

........................................................................................................................

(ඇ) සිංහලෙන් ලියන ලද පහත සඳහන් සංස්කෘත වචන **දේවනාගරී සංයුක්තාක්ෂරවලින්** ලියන්න.

I. දුර්භික්ෂ ........................................................................................

II. ස්ථාපනීයම් ........................................................................................

III. ඉතස්තතඃ ........................................................................................

VI. විශ්වසන්ති ........................................................................................

V. විශ්වබන්ධුත්වං ........................................................................................

IV. උක්තවාන් ........................................................................................

**01. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. එක් මාත්‍රාවක් තුළ උච්චාරණය වන අකුරු පමණක් ඇති වරණය වන්නේ,
(1) **अ ई ऊ ग ।** (2) **ए ऐ आ ॠ ।** (3) **इ अ उ ऋ ।** (4) **क अ ऌ ॠ ।**

2. දීර්ඝස්වර පමණක් ඇතුළත් වරණය මින් කුමක් ද?
**१. अ इ उ ऋ ।** **२. आ ई ऊ ॠ ।** **३. ए ल ओ औ ।** **४. अ आ इ ई ।**

3. ස්පර්ශාක්ෂර සංඛ්‍යාව වන්නේ,
(1) **२५** (2) **३०** (3) **४०** (4) **५९**

4. වර්ගාන්තාක්ෂර සංඛ්‍යාව වන්නේ,
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

5. අන්තඃස්ථාක්ෂර පමණක් ඇති වරණය වන්නේ,
**१. य र ल व ।** **२. य र ल ह ।** **३. श ष स ह ।** **४. य व र स ।**

# පාඩම 4 - නාමපද

**නිපුණතාව** : 2.0 සංස්කෘතභාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 විභක්තිවලට අනුව නාම වරනගයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- ස්වරයකින් අවසන් වන නාම ස්වරාන්ත ලෙස නම් කරයි.
- සංස්කෘත භාෂාවේ නාමවිභක්ති අටක් යටතේ වරනැගෙන බව ප්‍රකාශ කරයි.
- නාමවිභක්ති අට නම් කරයි.
- නාමවිභක්තිවල අර්ථ පහදයි.
- දෙනු ලබන අනෙකුත් ඕනෑ ම පුංලිඞ්ග ශබ්දයක් අනුපිළිවෙළට වරනගයි.
- දෙනු ලබන අනෙකුත් ඕනෑ ම ස්ත්‍රීලිඞ්ග ශබ්දයක් අනුපිළිවෙළට වරනගයි.
- දෙනු ලබන අනෙකුත් ඕනෑ ම නපුංසකලිඞ්ග ශබ්දයක් අනුපිළිවෙළට වරනගයි.
- ව්‍යඤ්ජනයකින් අවසන් වන නාම හලන්ත ලෙස නම් කරයි.
- නකාරාන්ත පුංලිඞ්ග 'රාජන්' ශබ්දය, දකාරාන්ත පුංලිඞ්ග 'ද්විපාද්' ශබ්දය, තකාරාන්ත පුංලිඞ්ග 'මරුත්' ශබ්දය සහ සකාරාන්ත පුංලිඞ්ග 'පුංස්' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.
- චකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'වාච්' ශබ්දය, තකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'සරිත්' ශබ්දය, ධකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'සමිධ්' ශබ්දය සහ දකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'සම්පද්' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.
- කකාරාන්ත නපුංසකලිඞ්ග 'සර්වශක්' ශබ්දය, චකාරාන්ත නපුංසකලිඞ්ග 'සුවාච්' ශබ්දය සහ ජකාරාන්ත නපුංසකලිඞ්ග 'අසෘජ්' ශබ්දය අනුපිළිවෙළට වරනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- ස්වරයකින් අවසන් වන නාම ස්වරාන්ත ලෙසත්, ව්‍යඤ්ජනයකින් හෙවත් හල් අකුරකින් අවසන් වන නාම හලන්ත ලෙසත්, පෙන්වා දෙන්න.
- සංස්කෘතභාෂාවේ ප්‍රධාන විභක්ති අටක් ඇති බව කියා දී ඒවා මතකයෙන් විමසා බලන්න.

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

- පෙර ශ්‍රේණිවල දී වනපොත් කරන ලද අකාරාන්ත, ඉකාරාන්ත හා උකාරාන්ත යන පුංලිඞ්ග ශබ්ද මතකයෙන් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

- සංස්කෘතභාෂාවේ නාම විභක්ති අටක් ඇති බවත්, ඒවා විවිධ අර්ථවල යෙදෙන බවත්, පහත වගුව ඇසුරින් පෙන්වා දෙන්න.

| विभक्ति | අර්ථය |
|---|---|
| प्रथमा | උක්තය |
| सम्बोधन | ආමන්ත්‍රණය |
| द्वितीया | කර්මය |
| तृतीया | (අනුක්ත කර්තෘ) විසින්, සමග |
| चतुर्थी | (සම්ප්‍රදානය) ට, පිණිස, සඳහා |
| पञ्चमी | (වෙන් වීම) ගෙන්, කෙරෙන්, වෙතින්, ඉන්, එන් |
| षष्ठी | (අයිතිය හැඟවීම) ගේ, ඒ, වල |
| सप्तमी | කෙරෙහි, හි, මත, උඩ, ඒ, වල |

- ඇමුණුම 1 යොදා ගනිමින් පුංලිඞ්ග **ऋ** කාරාන්ත ශබ්ද වරනැගීමට සිසුන් යොමු කරවන්න.

## පියවර 2

- පෙර ශ්‍රේණිවල දී වනපොත් කරන ලද ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද මතකයෙන් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. (ඇමුණුම 2)
- ඇමුණුම 2 යොදා ගනිමින් ඊකාරාන්ත, ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද වරනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

## පියවර 3

- පෙර ශ්‍රේණිවල දී වනපොත් කරන ලද අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද මතකයෙන් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඇමුණුම 3 යොදා ගනිමින් ඉකාරාන්ත, උකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද වරනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

පියවර 4

- සංස්කෘත නාමවරනැගිල්ලෙහි සහ පෙළපොතෙහි සඳහන් නාමවරනැගීම්වලට සිසු අවධානය යොමු කරන්න.
- ඇමුණුම 4 යොදා ගනිමින් ව්‍යඤ්ජනයකින් අවසන් වන නාම ව්‍යඤ්ජනාන්ත හෙවත් හලන්ත නම් වන බව පෙන්වා දෙන්න.
- ඇමුණුම 5 යොදා ගනිමින් නකාරාන්ත පුංලිඞ්ග 'රාජන්' ශබ්දය සියලු විභක්තිවල වරනගා ඒ අනුව අනෙක් ශබ්ද ද වරනැගෙන අයුරු පෙන්වා දෙන්න.
- ඇමුණුම 6 යොදා ගනිමින් චකාරාන්ත ස්ත්‍රීලිඞ්ග 'වාච්' ශබ්දය සියලු විභක්තිවල වරනගා ඒ අනුව අනෙක් ශබ්ද ද වරනැගෙන අයුරු පෙන්වා දෙන්න.
- ඇමුණුම 7 යොදා ගනිමින් කකාරාන්ත නපුංසකලිඞ්ග 'සර්වශක්' ශබ්දය සියලු විභක්තිවල වරනගා ඒ අනුව අනෙක් ශබ්ද ද වරනැගෙන අයුරු පෙන්වා දෙන්න.
- ඇමුණුම 8 අභ්‍යාසය කිරීමට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, ඍකාරාන්ත පුංලිඞ්ග ශබ්ද මතකයෙන් වරනැගීම
- ආකාරාන්ත, ඊකාරාන්ත, ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද මතකයෙන් වරනැගීම
- අකාරාන්ත නපුංසකලිඞ්ග ශබ්ද මතකයෙන් වරනැගීම
- ලිඞ්ගත්‍රයට අදාළ ශබ්දවල විභක්ති වචන අර්ථ අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- ව්‍යඤ්ජනයකින් අවසන් වන නාම හලන්ත ලෙස නම් කිරීම
- හලන්ත පුංලිඞ්ග ශබ්ද වරනගා මතකයෙන් වරනැගීම
- හලන්ත ස්ත්‍රීලිඞ්ග ශබ්ද වරනගා මතකයෙන් වරනැගීම
- හලන්ත නපුංසකලිඞ්ග ශබ්ද වරනගා මතකයෙන් වරනැගීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් - 1,2,3,4,5,6,7 සහ 8
- සංස්කෘත නාමවරනැගිල්ල
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
| --- | --- | --- | --- |
| प्रथमा | पिता | पितरौ | पितरः |
| सम्बोधन | हे पितः | हे पितरौ | हे पितरः |
| द्वितीया | पितरम् | पितरौ | पितॄन् |
| तृतीया | पित्रा | पितृभ्याम् | पितृभिः |
| चतुर्थी | पित्रे | पितृभ्याम् | पितृभ्यः |
| पञ्चमी | पितुः | पितृभ्याम् | पितृभ्यः |
| षष्ठी | पितुः | पित्रोः | पितॄणाम् |
| सप्तमी | पितरि | पित्रोः | पितृषु |

ඇමුණුම 2

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
| --- | --- | --- | --- |
| प्रथमा | नदी | नद्यौ | नद्यः |
| सम्बोधन | हे नदी | हे नद्यौ | हे नद्यः |
| द्वितीया | नदीम् | नद्यौ | नदीः |
| तृतीया | नद्या | नदीभ्याम् | नदीभिः |
| चतुर्थी | नद्यै | नदीभ्याम् | नदीभ्यः |
| पञ्चमी | नद्याः | नदीभ्याम् | नदीभ्यः |
| षष्ठी | नद्याः | नद्योः | नदीनाम् |
| सप्तमी | नद्याम् | नद्योः | नदीषु |

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | वधूः | वध्वौ | वध्वः |
| सम्बोधन | हे वधू | हे वध्वौ | हे वध्वः |
| द्वितीया | वधूम् | वध्वौ | वधूः |
| तृतीया | वध्वा | वधूभ्याम् | वधूभिः |
| चतुर्थी | वध्वै | वधूभ्याम् | वधूभ्यः |
| पञ्चमी | वध्वाः | वधूभ्याम् | वधूभ्यः |
| षष्ठी | वध्वाः | वध्वोः | वधूनाम् |
| सप्तमी | वध्वाम् | वध्वोः | वधूषु |

ඇමුණුම 3

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | अस्थि | अस्थिनी | अस्थीनी |
| सम्बोधन | हे अस्थि | हे अस्थिनी | हे अस्थीनी |
| द्वितीया | अस्थि | अस्थिनी | अस्थीनी |
| तृतीया | अस्थ्ना | अस्थिभ्याम् | अस्थिभिः |
| चतुर्थी | अस्थ्ने | अस्थिभ्याम् | अस्थिभ्यः |
| पञ्चमी | अस्थ्नः | अस्थिभ्याम् | अस्थिभ्यः |
| षष्ठी | अस्थ्नः | अस्थ्नोः | अस्थ्नाम् |
| सप्तमी | अस्थ्नि | अस्थ्नोः | अस्थिषु |

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | मधु | मधुनी | मधूनी |
| सम्बोधन | हे मधु , हे मधो | हे मधुनी | हे मधूनी |
| द्वितीया | मधु | मधुनी | मधूनी |
| तृतीया | मधुना | मधुभ्याम् | मधुभिः |
| चतुर्थी | मधुने | मधुभ्याम् | मधुभ्यः |
| पञ्चमी | मधुनः | मधुभ्याम् | मधुभ्यः |
| षष्ठी | मधुनः | मधुनोः | मधूनाम् |
| सप्तमी | मधुनि | मधुनोः | मधुषु |

ඇමුණුම 4

| නාමය | අන්ත්‍ය ස්වරය වෙන්කිරීම | අන්තය |
|---|---|---|
| मरुत् | मरु + त् | त කාරාන්ත |
| भिषज् | भिष + ज् | ज කාරාන්ත |
| चित्रलिख् | चित्रलि + ख् | ख කාරාන්ත |
| विपद् | विप + द् | द කාරාන්ත |
| द्वार् | द्वा + र् | र කාරාන්ත |
| सुवाच् | सुवा + च् | च කාරාන්ත |
| दण्डिन् | दण्डि + न् | न කාරාන්ත |
| पुंस् | पुं + स् | स කාරාන්ත |
| सर्वशक् | सर्वश + क् | क කාරාන්ත |
| आयुष् | आयु + ष् | ष කාරාන්ත |

ඇමුණුම 5

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | राजा | राजानौ | राजानः |
| सम्बोधन | हे राजन् | हे राजानौ | हे राजानः |
| द्वितीया | राजानम् | राजानौ | राज्ञः |
| तृतीया | राज्ञा | राजभ्याम् | राजभिः |
| चतुर्थी | राज्ञे | राजभ्याम् | राजभ्यः |
| पञ्चमी | राज्ञः | राजभ्याम् | राजभ्यः |
| षष्ठी | राज्ञः | राज्ञोः | राज्ञाम् |
| सप्तमी | राज्ञि / राजनि | राज्ञोः | राजसु |

ඇමුණුම 6

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | वाक् / वाग् | वाचौ | वाचः |
| सम्बोधन | हे वाक् / वाग् | हे वाचौ | हे वाचः |
| द्वितीया | वाचम् | वाचौ | वाचः |
| तृतीया | वाचा | वाग्भ्याम् | वाग्भिः |
| चतुर्थी | वाचे | वाग्भ्याम् | वाग्भ्यः |
| पञ्चमी | वाचः | वाग्भ्याम् | वाग्भ्यः |
| षष्ठी | वाचः | वाचोः | वाचाम् |
| सप्तमी | वाचि | वाचोः | वाक्षु |

ඇමුණුම 7

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | सर्वशक् | सर्वशकौ | सर्वशकः |
| सम्बोधन | हे सर्वशक् | हे सर्वशकौ | हे सर्वशकः |
| द्वितीया | सर्वशकम् | सर्वशकौ | सर्वशकः |
| तृतीया | सर्वशका | सर्वशग्भ्याम् | सर्वशग्भिः |
| चतुर्थी | सर्वशके | सर्वशग्भ्याम् | सर्वशग्भ्यः |
| पञ्चमी | सर्वशकः | सर्वशग्भ्याम् | सर्वशग्भ्यः |
| षष्ठी | सर्वशकः | सर्वशकोः | सर्वशकाम् |
| सप्तमी | सर्वशकि | सर्वशकोः | सर्वशक्षु |

ඇමුණුම 8

02. (අ) පහත සඳහන් ගද්‍යපාඨ සිංහලට නගන්න.

भद्रे किं मां यद्धविष्यसदृशं संभावयसि । तत्पश्य मे बुद्धिप्रभावं यावदेनं दुष्टसमुद्रं स्वचञ्च्वा शोषयामि । टिट्टिभ्याह अहो कस्ते समुद्रेण सह विग्रहः ।

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

भोः सर्वे मूर्खा यूयम् । नैते वह्निकणाः गुञ्जाफलानि एतानि । तत्किं वृथा श्रमेण । नैतस्माच्छीतरक्षा भविष्यति । तदन्विष्यतां कश्चिन्निर्वातो वनप्रदेशो गुहा वा गिरिकन्दरं वा ।

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

अथ कदाचित्तत्रानुषङ्गिकं वानरयूथमितश्चेतश्च परिभ्रमदागतम्। तत्रैकस्य कस्यचिच्छिल्पिनोऽर्धस्फाटितोऽञ्जनवृक्षदारुमयः स्तम्भः खदिरकीलकेन मध्यनिहितेन तिष्ठति। एतस्मिन्नन्तरे ते वानरास्तरुशिखरप्रासादश्रृङ्गदारुपर्यन्तेषु यथेच्छया क्रीडितुमारब्धाः।

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

स आह वत्स, सत्यमुपलक्षितं भवता। मया हि मत्स्यादनं प्रति परमवैराग्यतया सांप्रतं प्रायोपवेशनं तम्। तेनाहं समीपगतानपि मत्स्यान्न भक्षयामि।

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(ආ) පහත සඳහන් පද්‍යපාඨ සිංහලට නගන්න.

पूर्वे वयसि यः शान्तः स शान्त इति मे मतिः।<br>
धातुषु क्षीयमाणेषु शमः कस्य न जायते॥

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

कोकिलानां स्वरो रूपं नारिरूपं पतिव्रता।<br>
विद्या रूपं कुरूपाणां क्षमा रूपं तपस्विनाम्॥

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

इह लोके हि धनिनां परोऽपि स्वजनायते।<br>
स्वजनोऽपि दरिद्राणां सर्वदा दुर्जनायते॥

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

लालयेत् पञ्चवर्षाणि दशवर्षाणि ताडयेत्।
प्राप्ते तु षोडशे वर्षे पुत्रं मित्रवदाचरेत्॥

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

05. (අ) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| शब्द | विभक्ति | සිංහල අර්ථය |
|---|---|---|
| वनितायाम् | | |
| दण्डिना | | |
| प्रेक्षकाः | | |
| विद्यायाः | | |
| राष्ट्रस्य | | |
| वर्षासु | | |
| जनकान् | | |
| गुरुभिः | | |
| याचकानाम् | | |
| पितुः | | |

(ආ) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| आख्यातपद | लकार | वचन | සිංහල අර්ථය |
|---|---|---|---|
| वपते | लट् | | |
| नय | | | |
| पठिष्यति | | एकवचन | |
| पठानि | | | ලියන්නේ ය |
| लेखिष्यति | | | |
| हरतु | | | |
| चलताम् | | | |
| यच्छथ | | | |
| अधावत् | | | |
| वदन्ति | | | |

# පාඩම 5 - ආඛ්‍යාතපද

**නිපුණතාව** : 3.0 සංස්කෘතභාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම :** 3.1 ලට්, ලඞ්, ලෝට් සහ විධිලිඞ් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල :**

- ලියනු ලබන සරල වාක්‍යයන්හි ආඛ්‍යාතපදවල ඇති ලට්, ලඞ්, ලෝට් සහ විධිලිඞ් පරස්මෛපද ප්‍රත්‍ය වෙන්කොට දක්වයි.
- ලියනු ලබන සරල වාක්‍යයන්හි ආඛ්‍යාතපදවල ඇති ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් ආත්මනේපද ප්‍රත්‍ය වෙන්කොට දක්වයි.
- දෙනු ලබන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් ආඛ්‍යාතපද යෝජනා කරයි.
- ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් යන ලකාර හතරෙහි උභයපදයට අදාළ ව ඕනෑ ම ආඛ්‍යාත පදයක් වරනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- चल चल पुरतो निधेहि चरणम् ।
  सदैव पुरतो निधेहि चरणम् ॥
  गिरिशिखरे ननु निजनिकेतनम् ।
  विनैव यानं नगारोहणम् ।
  बलं स्वकीयं भवति साधनम् ।
  सदैव पुरतो …………….. //
- පෙළපොතෙහි සඳහන් මෙම ගීතය සිසුන් ද සමග ගායනා කරන්න.
- ගීතයේ අර්ථය පිළිබඳ විමසීමක් කොට ජීවිතාදර්ශයක් ලබා දෙන්න.
- එහි සඳහන් වන ක්‍රියාපද මාධ්‍යභාෂාවට පරිවර්තනය කරන්න.
- ඒවා අයත් වන පුරුෂ, වචන, ලකාර පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලබා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1 :**

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( ආඛ්‍යාත - කෘදන්ත තරඞ්ග) උපයෝග කරගනිමින් සිසුන් පෙර ශ්‍රේණිවල දී ඉගෙනගත් ලට්, ලඞ් හා ලෝට් ලකාරවල උභයපදයෙහි ප්‍රත්‍යයන් හා ක්‍රියාපද සාමූහික ව වරනගන්න.
- ඇමුණුම 1 සිසුන්ට ලබා දෙමින් එහි ඇති විධිලිඞ් ලකාර පරස්මෛපද ධාතුන්හි වරනැගීම් ශබ්ද නගා උච්චාරණය කරන්න.
- එය වනපොත් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඇමුණුම 2 සිසුන්ට ලබා දෙමින් එහි ඇති විධිලිඞ් ලකාර ආත්මනේපද ධාතුන්හි වරනැගීම් ශබ්ද නගා උච්චාරණය කරන්න.
- එය වනපොත් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පහත පාඨ යොදා ගනිමින් ලට්, ලඞ්, ලෝට් සහ විධිලිඞ් යන ලකාරවල භාවිත සනිදර්ශන ව පහදා දෙන්න.

  **लट् – छात्रः पुस्तकं पठति ।** (ශිෂ්‍යයා පොත හදාරයි.)

  **लङ् – छात्रः पुस्तकम् अपठत्** (ශිෂ්‍යයා පොත හැදෑරුවේ ය.)

  **लोट् – छात्रः पुस्तकं पठतु ।** (ශිෂ්‍යයා පොත හදාරාවා!)

  **लिङ् – छात्रः पुस्तकं पठेत् ।** (ශිෂ්‍යයා පොත හදාරන්නේ නම් මැනවි.)

- පෙළපොත යෙදා ගනිමින් එහි ඇති සරල වාක්‍යවල අඛ්‍යාතපදවල ඇති ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් පරස්මෛපද සහ ආත්මනේපද ප්‍රත්‍ය වෙන් කොට පෙන්වන්න.
- හුණු පුවරුවේ ලියනු ලබන හිස්තැන් සහිත වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් ආඛ්‍යාතපද සිසුන්ගෙන් විමසන්න.
- පෙළපොතෙහි පාඩම්වල සඳහන් ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් යන ලකාරවලට අදාළ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරවන්න.

**මූලික වදන් සංකල්පය :**

- විධිලිඞ් - විධානය හා සම්භාවනා අර්ථය සඳහා යෙදේ.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දෙනු ලබන ආඛ්‍යාතපදයක ලකාරය අනුව ධාතුමූලය හා ප්‍රත්‍යය වෙන් වෙන් ව ප්‍රකාශ කිරීම
- ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් යන ලකාරවල උභයපදයට අදාළ ව ධාතු වරනගා උචිත පරිදි භාවිත කිරීම
- ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් යන ලකාරවල ආඛ්‍යාතපද භාවිත කරමින් සරල වාක්‍යයන් නිර්මාණය කිරීම
- පුරුෂ හා වචනභේදය සැලකිල්ලට ගනිමින් සරල වාක්‍ය පරිවර්තනය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( ආඛ්‍යාත - කෘදන්ත තරඞ්ග)
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

විධිලිඞ් ලකාර පරස්මෛපද ප්‍රත්‍යයන් සහ ''භූ'' ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ईत् | ईताम् | ईयुः | भवेत्<br>වන්නේ නම් මැනවි | भवेताम्<br>(දෙදෙන) වන්නෙහු නම් මැනවි | भवेयुः<br>පාඩම් වන්නෙහු නම් මැනවි |
| मध्यमपुरुष | ईः | ईतम् | ईत | भवेः<br>වන්නෙහි නම් මැනවි | भवेतम्<br>(දෙදෙන) වන්නෙහු නම් මැනවි | भवेत<br>වන්නෙහු නම් මැනවි |
| उत्तमपुरुष | ईयम् | ईव | ईम | भवेयम्<br>වන්නෙමි නම් මැනවි | भवेव<br>(දෙදෙන) වන්නෙමු නම් මැනවි | भवेम<br>වන්නෙමු නම් මැනවි |

ඇමුණුම 2

විධිලිඞ් ලකාර ආත්මනේපද ප්‍රත්‍යයන් සහ ''පච්'' ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ईत | ईयाताम् | ईरन् | पचेत | पचेयाताम् | पचेरन् |
| मध्यमपुरुष | ईथाः | ईयाथाम् | ईध्वम् | पचेथाः | पचेयाथाम् | पचेध्वम् |
| उत्तमपुरुष | ईय | ईवहि | ईमहि | पचेय | पचेवहि | पचेमहि |

# පාඩම 6 - සන්ධි - ව්‍යඤ්ජනසන්ධිය

**නිපුණතාව** : 4.0 සංස්කෘතභාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 ව්‍යඤ්ජනසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :

- ව්‍යඤ්ජනසන්ධිය සහිත වචන නම් කරයි.
- ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේද නම් කරයි.
- ව්‍යඤ්ජනසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන්කොට පෙන්වයි.
- ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.
- ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ව්‍යඤ්ජනසන්ධිය සහිත පද උපුටා දක්වයි.
- ව්‍යඤ්ජනසන්ධිපද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතුකර පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- 'අජන්ත වාග්විද්‍යාවට හරිම දක්ෂයි.' යන වැකිය හුණු පුවරුවේ ලියන්න.
- එම වාක්‍යයේ අඩංගු සන්ධිපදවල විසන්ධිපද ලියා දැක්වීමට සිසුන්ට හැකි දැ යි විමසන්න.
- සිසුන්ගේ පෙර දැනුම අවදි කරවමින් විවිධ සන්ධිවලින් භාෂාවේ සිදුවන සුබෝච්චාරණය ඉස්මතු කර පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- 3 ශ්‍රේණියේ දී ඉගෙනගත් ස්වරසන්ධිය හා එහි ප්‍රභේද පිළිබඳ පෙර දැනුම විමසන්න.
- ඇමුණුම් 1 සිසුන්ට බෙදා දී ව්‍යඤ්ජන අක්ෂර සමග සිදුවන සන්ධිකාර්යය ව්‍යඤ්ජනසන්ධිය නමින් හඳුන්වන බව පැහැදිලි කරන්න.
- පෙළපොත යොදා ගනිමින් ව්‍යඤ්ජනසන්ධියේ ප්‍රභේද නිදසුන් සහිත ව හඳුන්වා දෙන්න.

  1 ලෝපසන්ධිය

  2 ආදේශසන්ධිය

  3 ආගමසන්ධිය

  4 ද්විත්වසන්ධිය

**පියවර 2**

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( සංඥා - සන්ධි - නාම - තරඞ්ග) භාවිත කරමින් ලැයිස්තු ගත කරගනු ලැබූ සන්ධිපද සමූහයක් සපයා ඒවා විසන්ධිකොට පෙන්වීමට සිසුන් මෙහෙයවන්න.
- ව්‍යඤ්ජනසන්ධියේ ප්‍රභේද හතර සිසු කණ්ඩායම්වලට පවරා මිනිත්තු දෙකක කාලයක් තුළ ඒ පිළිබඳ අනෙක් සිසුන් දැනුම්වත් කිරීමේ ක්ෂණික කථාවක් පැවැත්වීමට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්පය :**

- ව්‍යඤ්ජනසන්ධිය
- ව්‍යඤ්ජනසන්ධියේ ප්‍රභේද

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දෙන ලද ගද්‍යපද්‍ය පාඨවල ඇති ව්‍යඤ්ජනසන්ධිපද උපුටා විසන්ධි කොට දැක්වීම
- ව්‍යඤ්ජනසන්ධියේ ප්‍රභේද නම් කිරීම
- දෙන ලද විසන්ධිපද සන්ධි කිරීම සහ සන්ධිපද විසන්ධි කිරීම
- ව්‍යඤ්ජනසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන්කිරීම
- ව්‍යඤ්ජනසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- නිර්දිෂ්ටපාඨවලින් ව්‍යඤ්ජනසන්ධිය සහිත පද උපුටා දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( සංඥා - සන්ධි - නාම - තරඞ්ග)
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත

**ලෝපසන්ධිය :** ලෝපය යනු අකුරක් ඉවත් කිරීමයි. ව්‍යඤ්ජන ලෝපයේ දී සන්ධිවන පද දෙකේ අගපදයේ මුල ඇති ව්‍යඤ්ජනාක්ෂරය ලොප් වේ.

උදා : उत् + स्थास्यति

उत् + स् + थास्यति

उत्थास्यति

**ආදේශසන්ධිය :** අලුතෙන් අකුරක් පැමිණවීම ආදේශයයි. ව්‍යඤ්ජනාදේශය ප්‍රභේද 12කි.

(1) ඝෝෂාදේශය :

ස්වරයකට හෝ ඝෝෂාක්ෂරයකට මුලින් සිටි අඝෝෂාක්ෂරයකට ඝෝෂාක්ෂරයක් ආදේශ වේ.

උදා : वाक् + ईशः

वा + क् + ईशः

वा + ग् + ईशः

वागीशः

(2) අඝෝෂාදේශයඃ

අඝෝෂයකට පෙරටු ව සිටි ඝෝෂාක්ෂරයකට අඝෝෂයක් ආදේශ වේ.

උදා : तद् + कथम्

त + द् + कथम्

त + त् + कथम्

तत्कथम्

(3) වර්ගචතුර්ථාදේශයඃ

වර්ගයන්ගේ පළමු වන අකුරුවලින් පරව සිටි හ කාරයට එම වර්ගයේ ම සතරවැනි අකුර ආදේශ වේ.

උදා : वाक् + हरिः

वा + क् + हरिः

वा + ग् + हरिः

वाग् + घ् + ह् + अरिः

वाग् + घ् + अरिः

वाग्घरिः

(4) තද්වර්ගාන්තාදේශයඃ

පෙරපදයේ අග එම වර්ගයේ මුල් අකුර ඇතිවිට එම වර්ගයේ ම අන්ත අකුර ආදේශ වේ.

උදා : वाक् + मात्रम्

वा +क् +मात्रम्

वा+ङ्+ मात्रम्

वाङ्मात्रम् = वाग्मात्रम्

(5) තාලව්‍යාදේශයඃ

දන්තජ අකුරක් තාලුජ අකුරක් සමග බැඳෙන විට එම දන්තජ අකුරට තාලුජ අකුරක් ආදේශ වේ.

උදා : सत् +जनः

स +त् +जनः

स +ज् +जनः

सज्जनः

(6) මූර්ධන්‍යාදේශයඃ

දන්තජ අකුරක් මූර්ධජ අකුරක් සමග සංයෝග වන විට එම දන්තජයට මූර්ධජ අකුරක් ආදේශ වේ.

උදාඃ तत् +टीका

त +त् +टीका

त +ट् +टीका

तट्टीका

(7) ලකාරාදේශයඃ

ලකාරයෙන් පෙරටු ව සිටි තවර්ගයේ අකුරුවලට ලකාරය ආදේශ වේ.

උදාඃ श्रीमत् +लंका

श्रीम +त् +लंका

श्रीम +ल् +लंका

श्रीमल्लंका

(8) ඡකාරාදේශයː

වර්ගයක පළමුවන අකුරකින් පර ව සිටි ශ කාරයට ස්වරයක් හෝ ඝෝෂයක් පරකල්හි ඡකාරය ආදේශ වේ.

උදාː- वाक् +शूरः

वाक् +शू +रः

वाक्+छू +रः

वाक्छूरः

(9) ණ කාරාදේශයː

ඍ, ඎ, ර, ෂ යන අක්ෂරයන් කෙරෙන් පර වූ දන්තජ නකාරයට මූර්ධජ, කාරයක් ආදේශ වේ.

උදාː वृ +नुते

वृ +न् +उते

वृ +ण् +उते

वृणुते

(10) ෂකාරාදේශයː

නාමින් ස්වර, කවර්ගය, රකාරය යන අකුරුවලින් පර වූ ස කාරයට මූර්ධජ ෂ ආදේශ වේ.

උදාː करि +स्यति

करि +स् +यति

करि +ष् +यति

करिष्यति

(11) අනුස්වාරාදේශයː

ඞ, ඤ, ණ, න, ම යන අකුරු හැර වර්ගයන්ගේ සෙසු අකුරු ද ශ, ෂ, ස යන අකුරු තුන ද පරකල්හි පදාන්ත නොවූ මකාර නකාර දෙකට අනුස්වාරය වේ.

උදාː पयान् +सि

पया +न् +सि

पया+ं + सि

पयांसि

(12) මකාරාදේශයඃ

ස්වරයක් පරකල්හි අනුස්වාරයට මකාරය ආදේශ වේ.

උදාඃ किं +अस्ति

किं+ं +अस्ति

कि +म् +अस्ति

किमस्ति

**(02) ආගමසන්ධිය ඃ** ව්‍යඤ්ජන සන්ධියෙහි ආගම සතරාකාර වේ. ක කාරාගමය, ච කාරාගමය, ට කාරාගමය ස කාරාගමය යනුවෙනි.

1. ක ආගමය ඃ- උදා ඃ- प्राङ्+ शूरः

प्राङ्+ क्+ शूरः

प्राङ्क्शूरः

2. ච ආගමය ඃ- උදා ඃ- महाञ् +शूरः

महाञ् +च् +शूरः

महाञ्च्शूरः

3. ට ආගමය ඃ- උදා ඃ- सुगण् +शत्रु

सुगण् +ट् +शत्रु

सुगण्ट्शत्रु

4. ස ආගමය ඃ- උදා ඃ- भवान् +तनोति

भवान् +स् +तनोति

भावांस्तनोति

**(03) ද්විත්වසන්ධිය ඃ** ද්විත්ව යනු අකුරු දෙකක් බවට පත්වීමයි.

උදාඃ स + भ्यः

स +भ् +भ्यः

सभ्भ्यः

भाग् + यम् = भाग्ग्यम्   वाच् +यम् = वाच्चयम्   बेध् + ध्यम् = बोध्ध्यम्

# පාඩම 7 - සන්ධි - අනුස්වාරසන්ධිය

**නිපුණතාව** : 4.0 සංස්කෘතභාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 4.2 අනුස්වාරසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :

- අනුස්වාරසන්ධිය සහිත වචන නම් කරයි.
- අනුස්වාරසන්ධිය ප්‍රභේද නම් කරයි.
- අනුස්වාරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන්කොට පෙන්වයි.
- අනුස්වාරසන්ධියේ ප්‍රභේද පැහැදිලි කරයි.
- අනුස්වාරසන්ධිය ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනුස්වාරසන්ධිය සහිත පද උපුටා දක්වයි.
- අනුස්වාරසන්ධිපද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතුකොට පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

පියවර 1

- **लङ्का सञ्चारव्यापारम्** හුණු පුවරුවේ ලියන්න.
- එම වැකියේ අනුස්වාර සන්ධිපද ඇතැයි ප්‍රකාශ කොට ඒවා මතු කොට පෙන්විය හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- බින්දුව හෙවත් අනුස්වාරය සමග සිදුවන සන්ධි කාර්යය අනුස්වාරසන්ධිය ලෙස සිසුන්ට හඳුන්වා දෙන්න.
- පෙළපොතේ අදාළ පාඩම සහ සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( සංඥා - සන්ධි - නාම - තරඞ්ග) යොදා ගනිමින් අනුස්වාරසන්ධියේ ප්‍රභේද පිළිවෙළින් හඳුන්වා දෙන්න.
- ඇමුණුම 1 සිසුන්ට සපයා දී කවර්ගාදේශය, චවර්ගාදේශය, ටවර්ගාදේශය, තවර්ගාදේශය, පවර්ගාදේශයන්ට අයත් සන්ධිපද ඇතුළත් තීරු පහකින් යුතු වගුවක් නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 2**

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( සංඥා - සන්ධි - නාම - තරඞ්ග) භාවිත කරමින් ලැයිස්තු ගත කරගනු ලැබූ සන්ධිපද සමූහයක් සපයා ඒවා විසන්ධිකොට පෙන්වීමට සිසුන් මෙහෙයවන්න.
- අනුස්වාරසන්ධියේ ප්‍රභේද සිසු කණ්ඩායම්වලට පවරා ඒ ඒ සන්ධියට අදාළ සන්ධිපද ප්‍රදර්ශනය කිරීමට බ්‍රිස්ටල් (චාට්) සටහනක් බැගින් නිර්මාණය කරවන්න.
- නිර්මාණය කරන ලද (චාට්) සටහන් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

**මූලික වදන් සංකල්පය :**

- අනුස්වාරසන්ධිය
- අනුස්වාරසන්ධියේ ප්‍රභේද

**ඇගයීම හා තක්සේරුකරණය :**

- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනුස්වාරසන්ධිය සහිත පද උපුටා දක්වයි.
- අනුස්වාරසන්ධි ප්‍රභේද නම් කරයි.
- අනුස්වාරසන්ධිය සහිත වචන නම් කරයි.
- අනුස්වාරසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන්කොට පෙන්වයි.
- අනුස්වාරසන්ධිප්‍රභේද පැහැදිලි කරයි.
- අනුස්වාරසන්ධිප්‍රභේදවලට නිදර්ශන ඉදිරිපත් කරයි.
- අනුස්වාරසන්ධිපද විසන්ධි කර සන්ධිය සෑදී ඇති ආකාරය මතුකොට පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( සංඥා - සන්ධි - නාම - තරඞ්ග)
- බ්‍රිස්ටල් බෝඩ්

## ඇමුණුම 1

අනුස්වාරය ආදේශ කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් සිදුකරනු ලබන සන්ධි කාර්යය අනුස්වාරසන්ධිය වේ. මුල්පදයේ අග අනුස්වාරය ඇතිවිට එම අනුස්වාරයට එම වර්ගයේ ම අවසාන අකුර ආදේශ වේ. තව ද අනුස්වාරයට පසුව ව්‍යඤ්ජනාක්ෂරයක් යෙදේ නම් අනුස්වාරය වෙනස් නොවේ. අනුස්වාරයට පසුව ස්වරයක් යෙදේ නම් අනුස්වාරය 'ම්' බවට පත් වේ.

(1) කවර්ගාදේශයː උදාː लं +का

ल+ं+ का

ल+ङ् +का

लङ्का

(2) චවර්ගාදේශයː උදාː कुं +जरः

कु+ं+ जरः

कु+ञ् + जरः

कुञ्जरः

(3) ටවර්ගාදේශය ː උදාː तं + णकारम्

त +ं+णकारम्

त +ण् +णकारम्

तण्णकारम्

(4) තවර්ගාදේශයː උදාː तं +नयति

त +ं+ नयति

त +न् +नयति

तन्नयति

(5) පවර්ගාදේශයː උදාː किं +फलति

कि+ं+ फलति

कि +म् +फलति

किम्फलति

# පාඩම 8 - සමාස

**නිපුණතාව** : 5.0 සංස්කෘතභාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- අව්‍යයීභාව සමාසය හඳුන්වයි.
- අව්‍යයීභාව සමාසපද නම් කරයි.
- අව්‍යයීභාව සමාසප්‍රභේද නම් කරයි.
- අව්‍යයීභාව සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අව්‍යයීභාව සමාසපද උපුටා දක්වයි.
- තත්පුරුෂ සමාසය හඳුන්වයි.
- තත්පුරුෂ සමාසපද නම් කරයි.
- තත්පුරුෂ සමාසප්‍රභේද නම් කරයි.
- තත්පුරුෂ සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් තත්පුරුෂ සමාසපද උපුටා දක්වයි.
- ද්වන්ද්ව සමාසය හඳුන්වයි.
- ද්වන්ද්ව සමාසපද නම් කරයි.
- ද්වන්ද්ව සමාසප්‍රභේද නම් කරයි.
- ද්වන්ද්ව සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ද්වන්ද්ව සමාසපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1හි ප්‍රකාශ කඩදාසි තීරුවල ලියා කැමති සිසුන් අතර බෙදා දෙන්න.
- එම ප්‍රකාශ හුණුපුවරුවේ ලිවීමට සිසුන් යොමු කරන්න.
- ඒවායේ අරුත් පහදා දීමට සිසුන් මෙහෙයවන්න.
- එම ක්‍රියාකාරකම ඇසුරින් සමාස හඳුන්වා දෙන්න.
- **'රන් ද, රිදී ද, මුතු ද, මැණික් ද,'** යන්න හුණුපුවරුවේ ලියන්න.

- **'රන්, රිදී, මුතු, මැණික්,'** ලෙස ද කාරය ඉවත් කොට නැවත ලියන්න.
- පළමුවන වැකියත් දෙවන වැකියත් සිසුන් ලවා කියවන්න.
- සුබෝච්චාරණය ඇත්තේ ඉන් කවර වැකියේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- සමාසවල ඇති ලක්‍ෂණ දෙවන වැකිය තුළින් ඉස්මතු කර පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 02 සිසුන් අතරේ බෙදා දී මෙම ශ්‍රේණියේ දී පළමුවන සමාසවර්ග තුන ඉගෙන ගන්නා බව පැහැදිලි කරන්න.
- සමාසවල ප්‍රයෝජන පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඒ ඒ සමාසවර්ගයේ වෙනස්කම් මතුකොට පෙන්වන්න.
- එම සමාසවලට නිදසුන් ලැයිස්තුගත කිරීමට සිසුන් යොමු කරන්න.

**පියවර 2**

- පෙළපොත යොදා ගනිමින් සමාසපදයක් ඉදිරිපත් කළ විට එය ගොඩනැගී ඇති ආකාරය විස්තර සහිත ව පැහැදිලි කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- සමාස
- අව්‍යයීභාවසමාසය
- තත්පුරුෂසමාසය
- ද්වන්ද්වසමාසය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සමාස හඳුන්වා ප්‍රභේද නම් කරයි.
- අව්‍යයීභාව, තත්පුරුෂ, ද්වන්ද්ව සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් සමාසපද උපුටා දක්වයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( කාරක - සමාස -තද්ධිත තරඞ්ග)

**ඇමුණුම 1**

ප්‍රකාශ -

1. එකපදතා සංයුක්තම් :- එකපදයක් බවට පත්වීම
2. එකොච්චාරණතායුතම් :- එක උච්චාරණයක් වීම
3. එකවිභක්තිකත්වඤ්ච :- එක් විභක්තියක් වීම
4. සමාසශ්චාන්වයෙනාම්නාම් :- පද සංක්ෂිප්ත කිරීම

සමාස නම් වේ.

**ඇමුණුම 2**

'සමාසශ්චාන්වයෙ නාම්නාම්' යුක්තාර්ථවත් පදදෙකක් හෝ වැඩි ගණනක් එකපදයක් බවට පත්කිරීම සමාස නම් වේ. එකපදයක් බවට පත්වීම, එක උච්චාරණයක් වීම, එක විභක්තියක් වීම සමාසවල ප්‍රයෝජන වේ. සමාස ප්‍රභේද 06කි.

1. අව්‍යයීභාවසමාසය
2. තත්පුරුෂසමාසය
3. ද්වන්ද්වසමාසය
4. කර්මධාරයසමාසය
5. ද්විගුසමාසය
6. බහුව්‍රීහිසමාසය

**අව්‍යයීභාවසමාසය :** නිපාතයක් හෝ උපසර්ගයක් හෝ පෙරපදය වශයෙන් යෙදී සෑදෙන සමාසපදය අව්‍යයීභාව සමාසය වේ. මෙම සමාසය නපුංසකලිඞ්ග වීම අනිවාර්ය යි. (පූර්වේව්‍යයෙව්‍යයීභාවඃ)

උදා :- **समीपं नगरस्य** = **उपनगरम्**

**रूपस्य योग्यम्** = **अनुरूपम्**

**वाचं वाचं प्रति** = **प्रतिवाचम्**

**गुरोः समीपं** = **उपगुरु**

**තත්පුරුෂසමාසය :** ප්‍රථමා හා ආලපන විභක්ති හැර සෙසු විභක්ති සහිත පදයක් මුලින් යෙදී පසු පදයක් සමග සමාස වීමේ දී විභක්ති ලක්ෂණය ඉවත් වී පද එක්වීම තත්පුරුෂ සමාසයේ ලක්ෂණය යි. (අමාදෞ තත්පුරුෂඃ)

ද්වීතියා උදාඃ **नरकं पतितः** = **नरकपतितः**

**कालम् अतीतः** = **कालातीतः**

**देवम् आलयः** = **देवालयः**

**जलं मग्नः** = **जलमग्नः**

තෘතීයා උදා: मासेन पूर्वः = मासपूर्वः

वाचा कलहः = वाक्कलहः

चिन्तया आकुलः = चिन्ताकुलः

චතුර්ථී උදා: भूतेभ्यः बलिः = भूतबलिः

चीवराय वस्त्रम् = चीवरवस्त्रम्

यूपाय दारुः = यूपदारु

පඤ්චමී උදා: चोरात् भयम् = चोरभयम्

ग्रामात् निर्गतः = ग्रामनिर्गतः

काकेभ्यः बलिः = काकबलिः

ෂෂ්ඨී උදා: बुद्धस्य धर्मं = बुद्धधर्मं

सूर्यस्य प्रकाशः = सूर्यप्रकाशः

वृक्षस्य मूलम् = वृक्षमूलम्

සප්තමී උදා: कार्येषु कुशलः = कार्यकुशलः

वने वासः = वनवासः

भूतेषु दया = भूतदया

**ද්වන්ද්වසමාසය** : සමාසපද සෑදීමේ දී **च** යන නිපාතය ඉවත් කොට සමාසපදය ගැළපීම ද්වන්ද්වසමාසයේ විශේෂත්වය යි. (චාර්ථෙ ද්වන්ද්වඃ) ද්වන්ද්වසමාසය ප්‍රභේද 02කි.

1. සමාහාරද්වන්ද්ව :- සමාසපදය නපුංසකලිඞ්ග ද ඒකවචන ද වේ.

2. ඉතරෙතරයෝගද්වන්ද්ව :- ඒකවචනයට හා නපුංසකලිඞ්ග නොවී පරපදයේ ලිඞ්ගය ගනියි.

උදා: माता च पिता च = मातापितरौ

रामश्च लक्ष्मणश्च = रामलक्ष्मणौ

# පාඩම 9 - තද්ධිත

**නිපුණතාව** : 6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 තද්ධිතපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- අපත්‍යතද්ධිතය හඳුන්වයි.
- අපත්‍ය තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අපත්‍ය තද්ධිතපද උපුටා දක්වයි.
- භාවතද්ධිතය හඳුන්වයි.
- භාව තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් භාව තද්ධිතපද උපුටා දක්වයි.
- අස්ත්‍යර්ථ තද්ධිතය හඳුන්වයි.
- අස්ත්‍යර්ථ තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අස්ත්‍යර්ථ තද්ධිතපද උපුටා දක්වයි.
- සමූහාර්ථ තද්ධිතය හඳුන්වයි.
- සමූහාර්ථ තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් සමූහාර්ථ තද්ධිතපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සංස්කෘත භාෂාවේ අලංකාරයට හා සුබෝච්චාරණයට තද්ධිතවලින් සිදුවන මෙහෙය පෙන්වා දෙන්න.
- ඇමුණුම 1 යොදා ගනිමින් තද්ධිත පිළිබඳ හඳුන්වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම් අංක 2 යොදා ගනිමින් අපත්‍යතද්ධිතය, භාවතද්ධිතය, අස්ත්‍යර්ථතද්ධිතය, සමූහාර්ථ -තද්ධිතය යන තද්ධිත සතර පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- අපත්‍යය, භාව, අස්ත්‍යර්ථ සහ සමූහාර්ථ තද්ධිත වර්ග හතර සඳහා පිළිවෙළින් සපයා ඇති ඇමුණුම් අංක 3, 4, 5 සහ 6 කෙරෙහි අවධානය යොමු කරන්න.
- අදාළ තද්ධිත වර්ග හතරෙහි වෙනස්කම් පහදා දෙන්න.

**පියවර 2**

- එම තද්ධිතවර්ග 4 සඳහා සුදුසු පරිදි කාලච්ඡේද 3කට ආසන්න කාලයක් වෙන් කොට ගන්න.
- පහත සඳහන් පරිදි අදාළ තද්ධිත පාඩම්වල දී පෙළපොත යොදා ගන්න.
  - ➢ අපත්‍යතද්ධිතය - පෙළපොතේ 86 පිටුව සහ 11.1 හා 11.2 ක්‍රියාකාරකම්
  - ➢ භාවතද්ධිත - පෙළපොතේ 88, 89 පිටු සහ එම පිටුවේ 11.3 ක්‍රියාකාරකම්
  - ➢ අස්ත්‍යර්ථතද්ධිතය - පෙළපොතේ 92, 93, 94, 95 පිටු සහ 12.1 ක්‍රියාකාරකම්
  - ➢ සමූහාර්ථතද්ධිතය - පෙළපොතේ 97, 98 පිටු සහ 12.2 ක්‍රියාකාරකම්
  - ➢ ශ්ලෝක පාඨ අර්ථ සහිත ව වාචෝද්ගත කරවන්න. (98, පිටුව)
- එක් එක් තද්ධිතවර්ග පිළිබඳ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහත ක්‍රමය අනුගමනය කරන්න.
- ඇමුණුම 2 භාවිත කරමින් තද්ධිතවර්ගයට අදාළ හැඳින්වීම් පාඨය සිසුන් සමග සාමූහිකව හඬ නගා කියවන්න.
- උගන්වනු ලබන තද්ධිතවර්ගයට අදාළ ඇමුණුම සිසුන්ට සපයන්න. (ඇමුණුම් අංක 3 හෝ 4 හෝ 5 හෝ 6)
- එහි අඩංගු තද්ධිතපද ලැයිස්තුව සිසුන් සමග හඬ නගා කියවන්න.
- එහි විග්‍රහ වාක්‍ය සහ ප්‍රත්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් එම තද්ධිතපද ගොඩනැගී ඇති ආකාරය "හැකිනම් කියන්න" යනුවෙන් උද්‍යෝගීමත් ව ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම තද්ධිත ගොඩනැගී ඇති ආකාරය සාකච්ඡාවක් මගින් තහවුරු කරන්න.
- පෙළපොතේ අදාළ පාඩම කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් අභ්‍යාසවල නිරත කරවන්න.
- තමා පරිශීලනය කරනු ලබන නිර්දිෂ්ටග්‍රන්ථවලින් අදාළ තද්ධිත සඳහා නිදසුන් කිහිපයක් උපුටා දැක්වීමට අවස්ථාව දෙන්න.
- පන්තිය කණ්ඩායම් 4 කට බෙදා (පන්තියේ සිටින සිසුන්ගේ ප්‍රමාණය අනුව) ඇමුණුම 7 පරිදි කාඩ්බෝඩ් තීරු යොදා ගෙන තද්ධිත සම්බන්ධයෙන් ඉගෙනුම් ආධාරකයක් සැකසීමට සිසුන්ට 'පසුවැඩ' ලෙස පවරන්න.

**මූලික වදන් සංකල්ප :**

- තද්ධිත - ප්‍රත්‍යාර්ථ නාම ගණයට අයත් වේ.
- අපත්‍යාර්ථතද්ධිතය
- භාවතද්ධිතය
- අස්ත්‍යර්ථතද්ධිතය
- සමූහාර්ථතද්ධිතය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අපත්‍යය, භාව, අස්ත්‍යර්ථ, සමූහාර්ථ යන තද්ධිතවර්ග නිදර්ශන සහිත ව විස්තර කිරීම
- නිර්දිෂ්ටග්‍රන්ථවල ඇති තද්ධිතපද වර්ග උපුටා දැක්වීම
- තද්ධිතවර්ගවලට අයත් උදාහරණ වාචෝද්ගත කොට ප්‍රකාශ කිරීම
- තද්ධිතපද භාෂා භාවිතයේ දී අලංකාරයට හා සුබෝච්චාරණයට අවශ්‍ය පද විශේෂයක් බවට කරුණු දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1,2,3,4,5,6 සහ 7
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( කාරක - සමාස -තද්ධිත තරඞ්ග)

**ඇමුණුම් 1**

- තද්ධිත යනු කවරේ ද?

  නාමපදයන්ගේ අගට ප්‍රත්‍යය එකතු කිරීමෙන් නිපදවනු ලබන්නෝ තද්ධිත නාමයෝ ය.

- නාමයක් අගට අර්ථ ප්‍රත්‍යය හෙවත් විශේෂ ප්‍රත්‍යය එකතු කිරීම නිසා තද්ධිත ප්‍රත්‍යාර්ථ ගණයට අයත් වේ.

  උදා :

  - **विदेहस्य अपत्यम्** (විග්‍රහ වාක්‍යය)
  - **विदेहस्य** + **अण्** (තද්ධිත ප්‍රත්‍යය යෙදීමෙන්)
  - **विदेह** + **अ** (ඉත් අකුරු හා විභක්ති ලෝපයෙන්)
  - **वैदेह** + **अ** (වෘද්ධි වීමෙන්)
  - **वैदेह्** + **अ** (පූර්වස්වර ලෝපය)
  - **वैदेह** - තද්ධිත නාමය
  - **वैदेह** + **स्** (විභක්ති ප්‍රත්‍යය යෙදීමෙන්)
  - **वैदेहः** (විසර්ග ආදේශය)

- තද්ධිත නාමයක් නිර්මාණය වන ආකාරය ද ඉහත සඳහන් පරිදි සිදු වේ.

ඇමුණුම 2

**01. අපත්‍යතද්ධිතය**

- අපත්‍යාර්ථයෙහි හෙවත් 'දරුවා' යන අර්ථයෙහි ෂෂ්ඨී විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් ඒ ඒ ප්‍රත්‍යයන් යොදා නිපදවනු ලබන්නේ අපත්‍යතද්ධිත නම් වේ.

  නිදසුන් : **गोतमस्य + अपत्यम् - गौतमः**

  **शिवस्य + अपत्यम् - शैवः**

**02. භාවතද්ධිතය**

- ෂෂ්ඨී විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් භාවාර්ථයෙහි විවිධ ප්‍රත්‍යයන් යොදා නිපදවනු ලබන්නේ භාවතද්ධිත නම් වේ.

  නිදසුන් - **ब्राह्मणस्य भावः - ब्राह्मणता**

  **मृदोः भावः - मृदुता**

**03. අස්ත්‍යර්ථතද්ධිතය**

- එය ඔහුට ඇත්තේය යන අර්ථයෙහි ප්‍රථමා විභක්ත්‍යන්ත නාමයන්ගේ අගට යම් යම් ප්‍රත්‍යයන් ගළපා නිපදවනු ලබන්නේ අස්ත්‍යර්ථතද්ධිත නම් වේ.

  නිදසුන් : **प्रज्ञा अस्य अस्ति - प्राज्ञा**

  **जटा अस्य अस्ति - जटिलः**

**04. සමූහාර්ථතද්ධිතය**

- ෂෂ්ඨී විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් 'සමූහය' යන අර්ථයෙහි ඒ ඒ ප්‍රත්‍යයන් යොදා නිපදවනු ලබන්නේ සමූහාර්ථතද්ධිතය නම් වේ.

  නිදසුන් : **बन्धूनां समूहः - बन्धुता**

  **गावां समूहः - गोत्रा**

- අපත්‍යතද්ධිතපද

| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१. | अण् | शिवस्य अपत्यम् | शैवः |
| ०२. | अण् | गोतमस्य अपत्यम् | गौतमः |
| ०३. | इण् | दशरथस्य अपत्यम् | दाशरथिः |
| ०४. | इण् | उद्दालकस्य अपत्यम् | औद्दालकि |
| ०५. | यण् | गर्गस्य अपत्यम् | गार्ग्यः |
| ०६. | यण् | सोमस्य अपत्यम् | सौम्यः |
| ०७. | आयनण् | चन्द्रस्य अपत्यम् | चान्द्रायणः |
| ०८. | आयनण् | नडस्य अपत्यम् | नाडायणः |
| ०९ | ईयण् | पितृस्वसुः अपत्यम् | पैतृस्वस्रीयः |
| १०. | ईयण् | र्गगस्य अपत्यम् | गार्गीयः |

| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ११ | एयण् | अत्रेः अपत्यम् | आत्रेयः |
| १२ | एयण् | कपेः अपत्यम् | कापेयः |
| १३ | इनेयण् | कल्याण्याः अपत्यम् | कल्याणिनेयः |
| १४ | इनेयण् | कुलटायाः अपत्यम् | कौलटिनेयः |
| १५ | आरण् | गोधायाः अपत्यम् | गौधारः |
| १६ | आरण् | पण्डोः अपत्यम् | पाण्डारः |
| १७ | एरण् | नट्याःअपत्यम् | नाटेरः |
| १८ | एरण् | श्रमणस्य अपत्यम् | श्रामणेरः |
| १९ | ऐरण् | चटकायाः अपत्यम् | चाटकैरः |
| २० | किण् | व्यासस्य अपत्यम् | वैयासकिः |
| २१ | किण् | निषादस्य अपत्यम् | नैषादकिः |

ඇමුණුම් 4

01) භාවතද්ධිතපද

| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१. | ता | ब्राह्मणस्य भावः | ब्राह्मणता |
| ०२. | ता | मृदोः भावः | मृदुता |
| ०३. | ता | श्लिष्टस्य भावः | श्लिष्टता |
| ०४. | त्व | देवस्य भावः | देवत्वम् |
| ०५. | त्व | कवेः भावः | कवित्वम् |
| ०६. | त्व | पटोः भावः | पटुत्वम् |
| ०७. | यण् | पण्डितस्य भावः | पाण्डित्यम् |

| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०८. | यण् | सुमनस्य भावः | सौमनस्यम् |
| ०९. | डिमन् | लोहितस्य भावः | लोहितिमा |
| १०. | डिमन् | लघोः भावः | लधिमा |
| ११. | अण् | पटोः भावः | पाटवम् |
| १२. | अण् | लघोः भावः | लाघवम् |

ඇමුණුම් 5

අස්ත්‍යර්ථතද්ධිතපද

| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१. | वत् | भागः अस्य अस्ति | भागवान् |
| ०२. | वत् | श्रद्धा अस्य अस्ति | श्रद्धावान् |
| ०३. | मत् | गौः अस्य अस्ति | गोमान् |
| ०४. | मत् | आयुः अस्य अस्ति | आयुष्मान् |
| ०५. | इन | फलानि अस्य अस्ति | फलिनः |
| ०६. | इन् | दण्डः अस्य अस्ति | दण्डी |
| ०७. | ऊल | वातः अस्य अस्ति | वातूलः |
| ०८. | किन् | वातः अस्य अस्ति | वातकी |
| ०९. | इल | जटा अस्य अस्ति | जटिलः |
| १०. | वल | शिखा अस्य अस्ति | शिखावलः |
| ११. | आरक | शृगंम् अस्य अस्ति | शृगांरकः |
| १२. | इक | माया अस्य अस्ति | मायिकः |
| १३. | उर | (उन्नताः) दन्ताः सन्ति | दन्तुरः |

| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| १४. | विन् | तपः अस्य अस्ति | तपस्वि |
| १५. | आट | (कुत्सिता) वाक् अस्य अस्ति | वाचाटः |
| १६. | आल | (कुत्सिता) वाक् अस्य अस्ति | वाचालः |
| १७. | अण् | श्रद्धा अस्य अस्ति | श्राद्धः |
| १८. | व | केशाः अस्य सन्ति | केशवः |
| १९. | त | पर्वाणि अस्य सन्ति | पर्वतः |
| २०. | ति | शम् अस्य अस्ति | शन्तिः |
| २१. | तु | शम् अस्य अस्ति | शन्तुः |
| २२. | श | लोमानि अस्य सन्ति | लोमशः |
| २३. | र | मुखम् अस्य अस्ति | मुखरः |
| २४. | र | मधु अस्य अस्ति | मधुरः |
| २५. | लु | कृपा अस्य अस्ति | कृपालुः |
| २६. | आलु | हृदयम् अस्य अस्ति | हृदयालु |


සමූහාර්ථතද්ධිතපද


| අනුඅංකය | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१. | ता | बन्धूनां समूहः | बन्धुता |
| ०२. | या | वातानां समूहः | वात्या |
| ०३. | इनी | खालानं समूहः | खलिनी |
| ०४. | त्रा | गवां समूहः | गोत्रा |
| ०५. | कड्या | रथानां समूहः | रथकड्या |
| ०६. | अण् | भिक्षाणां समूहः | भैक्षम् |
| ०७. | यण् | केदाराणां समूहः | कैदार्यम् |
| ०८. | कण् | धेनूनां समूहः | धैनुकम् |
| ०९ | इकण् | केदाराणां समूहः | कैदारिकम् |

- ඉහත සඳහන් ඇමුණුම්වල සඳහන් කළ තද්ධිතනාම හා ප්‍රත්‍යය වාචෝද්ගත කරවීම සඳහා තවත් සුදුසු ක්‍රමයක් යොදාගැනීම ගුරුවරයාගේ අත්දැකීම් අනුව සකසා ගැනීමට අවකාශ ඇති බව ද සැලකිල්ලට ගනිමින් පාඩම සැලසුම් කරන්න.

**ඇමුණුම 7**

නිදසුන -


සිදුර
තද්ධිතවර්ගය
සමූහාර්ථතද්ධිත
बन्धुता – බන්ධුතා
කාඩ්බෝඩ් තීරුවේ උඩ පැත්ත
ප්‍රත්‍යය
විග්‍රහවාක්‍යය
තද්ධිතපදය
ता
बन्धूनां समूहः
बन्धुता
කාඩ්බෝඩ් තීරුවේ යට පැත්ත
2 1/2 cm
10 cm



# පාඩම 10 - කෘදන්ත

**නිපුණතාව** : 7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 7.1 ත්‍රෛකාලික කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- ත්‍රෛකාලික කෘදන්ත හඳුන්වයි.
- ත්‍රෛකාලිකකෘදන්තවල ප්‍රත්‍යය 24 වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.
- ප්‍රත්‍ය 24ට අදාළ ත්‍රෛකාලිකකෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ත්‍රෛකාලික කෘදන්තපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- පෙළපොතේ 13 පාඩමේ සංවාදය උපුටාගත් කොටසක් සිසුන් ලවා කියවන්න.
- ඉරි ඇඳ ඇති පද කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
- ඒවා කෘදන්ත බව පහදා දෙමින් සාකච්ඡාවක නිරතවන්න.

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

- තෙවන ශ්‍රේණියේ දී උගත් කෘදන්ත පිළිබඳ සිසුන්ට සිහි ගන්වන්න.
- මෙම ශ්‍රේණියේ දී ත්‍රෛකාලිකකෘදන්ත පිළිබඳ පමණක් අධ්‍යයනය කරන බව දැනුම් දෙන්න.
- ඇමුණුම 1 ඇසුරින් ත්‍රෛකාලිකකෘදන්ත ප්‍රත්‍යය 24 ක් ඇති බව පෙන්වා දෙන්න.
- පෙළපොත සහ සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( ආඛ්‍යාත - කෘදන්ත තරඞ්ග) භාවිත කරමින් **तु** / **अच्** / **अ** / **ण्वुल्** / **अक** / **णिनि** / **इन्** / **क** / **अन** ප්‍රත්‍යයවලට අදාළ කෘදන්තපදවලට උදාහරණ සිසුන්ට පෙන්වා දෙන්න.
- ඇමුණුම 2 ඇසුරින් ත්‍රෛකාලිකකෘදන්ත ගොඩනැගී ඇති අයුරු සිසුන්ට පහදා දෙන්න.
- පහත කරුණු තහවුරු වන සේ සමාලෝචනයක නිරතවන්න.

  **- कृत् + अन्त** යන පද සංයෝග වීමෙන් කෘදන්ත යන්න සෑදී ඇත.

  - ත්‍රෛකාලිකකෘදන්ත යනු තුන්කාලයෙහි ම කරන තැනැත්තා හඳුන්වන නාමයි.

  - ත්‍රෛකාලික කෘදන්තනාම සාදාගත හැකි ප්‍රත්‍යය 24 ක් ඇත.

  - එම ප්‍රත්‍යයයෝ ත්‍රෛකාලිකකෘදන්ත ප්‍රත්‍යයෝ නම් වෙති.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ත්‍රෛකාලිකකෘදන්ත අර්ථ දැක්වීම
- ත්‍රෛකාලිකකෘදන්ත ප්‍රත්‍යය 24 නම් කිරීම
- ත්‍රෛකාලිකකෘදන්ත ප්‍රත්‍යය 24 ට අදාළ කෘදන්තපද ලැයිස්තු ගත කිරීම
- ශ්ලෝක හා වාක්‍යවල ඇති කෘදන්තපද උපුටා දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01 හා 02
- සංස්කෘත භාෂාව - සිව්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( ආඛ්‍යාත - කෘදන්ත තරඞ්ග)

**ඇමුණුම 1**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| तुच् | आक | क | अस | णिनि | श | ण | ट |
| ख | खि | खस् | ख्युद् | च्वि् | डाच् | ठक् | विण् |
| मनिप् | क्वनिप् | वनिप् | केलिम् | केलिम | ड | इ | अ |

**ඇමුණුම 2**

**ත්‍රෛකාලිකකෘදන්ත** - තනි කෘදන්ත පදයකින් කාලත්‍රය ම නිරූපණය වේ නම් ඒ ත්‍රෛකාලික කෘදන්ත යි. මෙය නාමපදයක් ලෙස භාවිත වේ.

**यच् + अकः > याचकः**

**वधकः । दायकः । खनकः । पावकः ।नर्तकः।**

**<u>याचकः</u> अयाचत् । <u>याचकः</u> याचति । <u>याचकः</u> याचिष्यति ।**

# පාඩම 11 - වාක්‍යනිර්මාණය

**නිපුණතාව** : 8.0 සංස්කෘතභාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 සම්බන්ධීකාරකපද සහ ප්‍රශ්නවාචීපද සහිත පූර්ණ වාක්‍ය ගොඩනගයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- සම්බන්ධීකාරකපද හඳුන්වයි.
- සම්බන්ධීකාරකපද ගොනු කරයි.
- සම්බන්ධීකාරකපද යොදා ගනිමින් වාක්‍යනිර්මාණය කොට ප්‍රකාශ කරයි; ලියයි.
- ඡේදයක ඇති සම්බන්ධීකාරකපද සහිත වාක්‍ය උපුටා දක්වයි.
- සම්බන්ධීකාරකපද සහිත වාක්‍ය පරිවර්තනය කරයි.
- ප්‍රශ්නවාචීපද හඳුන්වයි.
- ප්‍රශ්නවාචීපද ගොනුකරයි.
- ප්‍රශ්නවාචීපද යොදා ගනිමින් වාක්‍යනිර්මාණය කොට ප්‍රකාශ කරයි; ලියයි.
- ඡේදයක ඇති ප්‍රශ්නවාචීපද සහිත වාක්‍ය උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 පිටුපෙරළනයේ 1 පිටුවේ අඩංගු සම්බන්ධීකාරකපද ලැයිස්තුව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ඒවා යොදා සංස්කෘත භාෂාවෙන් වාක්‍යනිර්මාණය කරවන්න.
- එම වාක්‍ය දේවනාගරී අකුරෙන් හුණුපුවරුවේ ලියවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- **यदा - तदा, यद्यपि - तथापि, यदि - तर्हि, यथा - तथा, यावत् - तावत्, चेत्, नो चेत्** යන වචන ප්‍රදර්ශනය කරන්න.
- එම වචන ශබ්ද නගා කියැවීමට සිසුන් යොමු කරන්න.
- එම වචනවල අර්ථය සාකච්ඡා කරන්න.
- මෙම පද භාවිත කරන අවස්ථා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙම පදවලට කියන පොදු නාමය සම්බන්ධීකාරකපද බව පෙන්වා දෙන්න.

### පියවර 2

- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න, ඇමුණුම 2හි ඇතුළත් කාර්ය පත්‍රිකා ඔවුන්ට ලබාදෙන්න.
- පෙළපොත ඇසුරින් එම කාර්ය පත්‍රිකා සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.

### පියවර 3

- සිසුන් කණ්ඩායම් පහක් ලෙස සකස් කරන්න.
- ඇමුණුම් 1 පිටුපෙරළනයේ 1 සිට 5 පිටුව දක්වා පැහැදිලි කිරීමට කණ්ඩායම්වලට මිනිත්තු 5 බැගින් ලබා දෙන්න.
- සම්බන්ධීකරණපද පිළිබඳ සමාලෝචනයක නිරත වන්න.

### පියවර 4

- ඇමුණුම් 1 පිටුපෙරළනයේ 6 පිටුවේ ඇති ශ්ලෝකය ප්‍රදර්ශනය කොට සිසුන් සමග ශබ්ද නගා සජ්ඣායනා කරන්න.
- එම පිටුපෙරළනයේ 7 පිටුවේ ඉරි ඇඳිපදවලින් විමසන ප්‍රශ්න ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒවායේ අර්ථ මාධ්‍යභාෂාවෙන් විමසන්න.
- මෙම පද කවර අවස්ථාවල දී භාවිත කරන්නේ දැයි විමසන්න.
- මෙම පද හඳුන්වන පොදුනාමය ප්‍රශ්නවාචීපද බව පැහැදිලි කරන්න.
- වෙනත් ප්‍රශ්නවාචීපද ද ඉදිරිපත් කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

### පියවර 05

- පෙළපොතේ අභ්‍යාස සහ ඇමුණුම 3 අභ්‍යාසය කිරීමට සිසුන් යොමු කරන්න.
- සම්බන්ධීකාරකපද සහ ප්‍රශ්නවාචීපද පිළිබඳ සිසු දැනුම තහවුරු වන සේ සමාලෝචන සාකච්ඡාවක් මෙහෙයවන්න.

### මූලිකවදන් සංකල්පය :

- සම්බන්ධීකාරකපද
- ප්‍රශ්නවාචීපද

### ඇගයීම හා තක්සේරුකරණය :

- සම්බන්ධීකාරකපද යන්න නිර්වචනය කිරීම
- සංස්කෘතභාෂාවේ සම්බන්ධීකාරකපද සහිත වාක්‍ය උපුටා දැක්වීම
- සංස්කෘතභාෂාවේ එදිනෙදා භාවිත වන සම්බන්ධීකාරකපද පෙළ ගැසීම
- සම්බන්ධීකාරකපද යොදා ගනිමින් සංස්කෘත වාක්‍යනිර්මාණය කොට ප්‍රකාශ කිරීම/ලිවීම
- ප්‍රශ්නවාචීපද යන්න නිර්වචනය කිරීම
- සංස්කෘතභාෂාවේ ප්‍රශ්නවාචීපද යොදා සංස්කෘත වාක්‍යනිර්මාණය කිරීම
- එදිනෙදා භාවිත වන සංස්කෘත භාෂාවේ ප්‍රශ්නවාචීපද ලැයිස්තු ගත කිරීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 1,2 සහ 3
- සංස්කෘත භාෂාව, සිව්වන ශ්‍රේණිය, පෙළපොත

ඇමුණුම 1

**පිටුපෙරළනය**

01 පිටුව

| | |
|---|---|
| यदा - तदा | यद्यपि - तथापि |
| यदि - तर्हि | यथा - तथा |
| यावत् - तावत् | चेत् |
| नो चेत् | |

02 පිටුව

සම්බන්ධීකාරකපද යනු

වාක්‍ය සම්බන්ධකරන උපකාරකපද යි.

සම්බන්ධීකාරකපද ගොනුවක් මෙසේ ය.

| | |
|---|---|
| **यदा - तदा** = යම්විටක - එවිට | **यद्यपि - तथापि** = නමුත් |
| **यदि - तर्हि** = ඉදින් - එසේ නම් | **यथा - तथा** = යම්සේ ද - එසේ |
| **यावत् - तावत्** = යම් තාක් - ඒතාක් | **चेत्** = ඉදින් /එසේ නම් |
| **नो चेत्** = එහෙම නැත්තම් | |

03 පිටුව

සම්බන්ධීකාරකපද යොදා ගනිමින් වාක්‍යනිර්මාණය කිරීම

यदा - तदा = යම් විටක - එවිට,

| සාමාන්‍ය වාක්‍ය | සම්බන්ධීකාරකපද යෙදූ වාක්‍ය |
| --- | --- |
| त्वं तत्र न गच्छसि। अहमपि न गच्छामि। | - यदा त्वं तत्र न गच्छसि तदा अहमपि न गच्छामि। |
| दानं ददाति। स्वर्गं प्रयाति। | - यदा दानं ददाति तदा स्वर्गं प्रयाति। |

यद्यपि - तथापि, = නමුත්

यद्यपि स पण्डितः तथापि संस्कृतं न वदति।

यद्यपि सा रमणीया तथापि दरिद्रा भवति।

04 පිටුව

यदि - तर्हि = ඉදින් - එසේ නම්

यदि सम्यग् पठति तर्हि परीक्षणविषये भयं मा कुरु।

यदि विपत्तिः स्यात् तर्हि भेदनं न योग्यम्।

यथा - तथा = යම් සේ ද - එසේ

यथा पिता तथा पुत्रः।

यथा मतिः तथा गतिः।

05 පිටුව

यावत्-तावत् =යම් තාක් - ඒතාක්

त्वं यावत् इच्छसि तावत् गृहाण।

यावत् दत्तं तावत् भुक्तम्।

चेत् = ඉදින් / එසේ නම්

गच्छ गच्छसि चेत् कान्त

पठितुम् इच्छसि चेत् शास्त्रालयं गच्छ

नो चेत् = එහෙම නැත්තම්

तूष्णीं तिष्ठ नो चेत् ताडयिष्यामि।

धर्मं चर नो चेत् संसारे दुःखं भविष्यति।

06 පිටුව

कथं कदा कियत् कुत्र - किमर्थं किं करोम्यहम्।

कस्यार्थे च कया शक्त्या - चिन्तयेयं मुहुर्मुहुः॥

07 පිටුව

कथं कदा कियत् कुत्र - किमर्थं किं करोम्यहम्।

कस्यार्थे च कया शक्त्या - चिन्तयेयं मुहुर्मुहुः॥

ඇමුණුම 2

# කාර්යපත්‍රිකා

01.

- සම්බන්ධීකාරකපද යන්න නම් කරන්න.
- සම්බන්ධීකාරකපද ගොනු කරන්න.
- **यदा-तदा** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කොට එහි අර්ථය ලියන්න.

02.

- සම්බන්ධීකාරකපද යන්න නම් කරන්න.
- **यद्यपि-तथापि** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කර එහි අර්ථය ලියන්න.
- **चेत्** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කොට එහි අර්ථය ලියන්න.

03.

- සම්බන්ධීකාරකපද ගොනු කරන්න.
- **यदि-तर्हि** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කර එහි අර්ථය ලියන්න.
- **यथा-तथा** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කොට එහි අර්ථය ලියන්න.

04.

- සම්බන්ධීකාරකපද ගොනු කරන්න.
- **यावत्-तावत्** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කොට එහි අර්ථය ලියන්න.
- **नोचेत्** ප්‍රයෝගය යොදා වාක්‍ය හතරක් නිර්මාණය කොට එහි අර්ථය ලියන්න.

ඇමුණුම 3

1. ප්‍රශ්නවාචීපද හඳුන්වන්න.

2. ප්‍රශ්නවාචීපද ගොනු කරන්න.

3. කන්න එපා, ලියන්න එපා, සිනාසෙන්න එපා යන වාක්‍ය සංස්කෘත භාෂාවේ දී නිර්මාණය කරගන්නා අයුරු පැහැදිලි කරන්න.

4. **तव**, **मम**, **तस्य**, **तस्याः** යන පද සමග ප්‍රශ්නවාචීපද යෙදෙන අයුරු එකපදයකට උදාහරණ දෙකක් සපයමින් පැහැදිලි කරන්න.

5. **कुत्र** + **अपि** = **कुत्रापि** = **කොහේවත්**, යනපදය භාවිත කර වාක්‍ය දෙකක් නිර්මාණය කොට අර්ථය ලියන්න.

6. **किञ्चित्** + **अपि** = **किञ्चिदपि** = **මොකවත්**, යන පදය භාවිත කොට වාක්‍ය දෙකක් නිර්මාණය කොට අර්ථය ලියන්න.

7. **कथम्** + **अपि** = **कथमपि** = **කොහොමහරි**, යන පද භාවිත කොට වාක්‍ය දෙකක් නිර්මාණය කොට අර්ථය ලියන්න.

8. **कदा** + **अपि** = **कदापि** = **කවදාහරි**, යන පද භාවිත කොට වාක්‍ය දෙකක් නිර්මාණය කොට අර්ථය ලියන්න.

9. **कथं**, **किं**, **कदा**, **किमर्थं**, **कुत्र**, **केन** යන ප්‍රශ්නවාචීපද යොදා ගනිමින් ප්‍රශ්න දෙක බැගින් සකසා ඒවාට ගැළපෙන පිළිතුරු ද ලියා අර්ථය ද දක්වන්න.

# පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - ප්‍රථමාදර්ශය

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 ප්‍රථමාදර්ශය අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 27 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රථමාදර්ශය - (16 - 30) ගද්‍ය සහ පද්‍ය (ශ්ලෝක) කියවයි.
- මව්බසට පරිවර්තනය කරයි.
- සංස්කෘතභාෂාවෙන් විමසන ප්‍රශ්නවලට සංස්කෘතභාෂාවෙන් ම පිළිතුරු සපයයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- කිසියම් සංස්කෘත කාටූනයක් ප්‍රස්තුතීකරණ (Multi Media) හෝ තාක්ෂණික මාධ්‍ය භාවිත කොට නරඹන්නට සලස්වන්න.
- එම කථාවේ අර්ථය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- නරඹන ලද කාටූනය ඇසුරෙන් සංස්කෘත භාෂාවෙන් ප්‍රශ්න විමසමින් සංස්කෘත භාෂාවෙන් ම පිළිතුරු සැපයීමට සිසුන් මෙහෙයවන්න.
- මෙවැනි කථා සහ පද්‍ය (ශ්ලෝක) අඩංගු චිත්තාකර්ෂණීය ග්‍රන්ථයක් ලෙස ප්‍රථමාදර්ශය හඳුන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

- සිසු කණ්ඩායම්වලට ප්‍රථමාදර්ශය ග්‍රන්ථ ලබා දෙන්න.
- ප්‍රථමාදර්ශයේ 16-30 පාඩම්වල අඩංගු ගද්‍ය සහ පද්‍ය හඬනගා කියවීමට සිසුන් මෙහෙයවන්න.
- ඒවායෙහි අර්ථය පැහැදිලි කරන්න.
- අදාළ පාඩම්වල කොටස් මව්බසට පරිවර්තනය කිරීමට සිසුන්ට කේවල වශයෙන් අවස්ථාව දෙන්න.
- එහි එන දුරවබෝධ පදවල අර්ථය වාචෝද්ගත කරවන්න.
- ඒ ඒ පාඩම්වල ඇති සංස්කෘතභාෂාවෙන් විමසන ප්‍රශ්න සඳහා සංස්කෘතභාෂාවෙන් ම පිළිතුරු සැපයීමට සිසුන් මෙහෙයවන්න.

- ප්‍රථමාදර්ශයේ තෝරාගත් ගද්‍ය කොටසක් සාකච්ඡා කිරීම සඳහා විද්වද් බුද්ධිමණ්ඩල සාකච්ඡාවක් සංස්කෘතභාෂාවෙන් පැවැත්වීමට සිසුන් මෙහෙයවන්න.
- ප්‍රථමාදර්ශයේ පද්‍ය (ශ්ලෝක) සජ්ඣායනා තරගයකට සිසුන්ට අවස්ථාව දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රථමාදර්ශයේ ගද්‍ය සහ පද්‍ය මව්බසෙන් ගෙන හැර දැක්වීම
- සංස්කෘතභාෂාවෙන් සාකච්ඡාවක් පැවැත්වීම
- සංස්කෘතභාෂාවෙන් අසන ප්‍රශ්නවලට සංස්කෘතභාෂාවෙන් ම පිළිතුරු සැපයීම

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රව්‍යදෘශ්‍ය උපකරණ හා තාක්ෂණික මාධ්‍ය
- ප්‍රථමාදර්ශය ග්‍රන්ථ කිහිපයක්

# පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - චාණක්‍යශතකය

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.2 චාණක්‍යශතකය අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** : 9.2

- චාණක්‍යශතකයේ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- චාණක්‍යශතකයේ ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.
- චාණක්‍යශතකයේ ශ්ලෝක රසවිඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- චාණක්‍යශතකය ග්‍රන්ථය පන්තියට රැගෙන ගොස් පෙන්වා එහි ග්‍රන්ථ නාමය සිසුන් ලවා කියවන්න.
- සිසුන් දන්නා තවත් ශතකකාව්‍ය ඔවුන් ලවා හුණුපුවරුවේ ලියවන්න.
- ශතකයක් යන්න කුමක්දැයි සිසුන්ගෙන් විමසන්න.
- භාරතීය ශතකකාව්‍ය හා ශ්‍රී ලාංකේය ශතකකාව්‍ය පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න.
- චාණක්‍යශතකයෙහි අදාළ ශ්ලෝක සිසුන් සමග උස් හඬින් කියවන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සංස්කෘත පාඨමාලා 04 ග්‍රන්ථය ඇසුරින් චාණක්‍යශතකයේ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවීමට උපදෙස් ලබා දෙන්න.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවන ලද ශ්ලෝක අතුරින් 04, 07, 11, 12, 13, 17, 20 වනපොත් කරවන්න. (ඇමුණුම 01)
- නියමිත ව්‍යාකරණ ලක්ෂණයන්ට අනුව තාල බෙදීමට අනුව සිසුන් වෙතින් කියැවෙන්නේ ද යන්න නිරීක්ෂණයෙහි යෙදෙන්න. (අල්පප්‍රාණ - මහාප්‍රාණ) යන්න අනුව.
- නිසි අවබෝධය තුළින් මැනවින් සිතේ ධාරණය කර ගැනීමට හැකි බව සිසුන්ට අවධාරණය කරන්න.

- කියවන ලද ශ්ලෝකයක් හුණුපුවරුවේ ලියා නැවත නැවත උස් හඬින් කියැවීමට උපදෙස් දෙන්න.
- හුණුපුවරුවේ ලියන ලද ශ්ලෝක සිසුන්ට මතකයෙන් කියැවීමට උපදෙස් දෙන්න.
- කියවන ලද ශ්ලෝකයන්හි අර්ථ එකින් එක පැහැදිලි කර දෙන්න.

## පියවර 2

- චාණක්‍යශතකයෙන් උපුටා ගන්නා ලද පහත දැක්වෙන ශ්ලෝක සඳහා සුදුසු පරිදි කාලච්ඡේද 20 ක් බෙදා වෙන්කර ගන්න.
  4, 7, 11, 12, 13, 14, 16, 17, 20, 21, 23, 24, 26, 34, 35, 40, 44, 46, 47, 57, 60, 68, 73, 76, 81, 85, 92, 93, 102, 105
- සංස්කෘත පාඨමාලාව 4 යොදා ගනිමින් ඒ ඒ දිනයට නියමිත ශ්ලෝක වෙත සිසු අවධානය යොමු කරවන්න.
- සෑම ශිෂ්‍යයකුට ම අවස්ථාව ලැබෙන පරිදි අදාළ ශ්ලෝකය/ශ්ලෝක ඛණ්ඩය නිවැරදි උච්චාරණයෙන් යුතු ව හඬනගා සජ්ඣායනය කරවන්න.
- ගුරුභවතාගේ උදව් ඇති ව එම ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරමින් රස විඳීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- චාණක්‍යශතකයේ ශ්ලෝක අවබෝධයත්, පරිශීලනයත් තම ජීවිතයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.
- සෑම ශිෂ්‍යයකුට ම 4cm X 8cm කාඩ්පතක් සපයා එහි එක් පැත්තක ශ්ලෝකය ද යටි පැත්තේ සිංහල අර්ථය ද ලිවීමට යොමු කොට පොදු පරිහරණය සඳහා කාඩ් එකතුවක් සකසන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශතකකාව්‍යයක් යන්න පැහැදිලි කිරීම
- භාරතීය සහ ශ්‍රී ලාංකේය ශතකකාව්‍යයන් නම් කිරීම
- චාණක්‍යශතකයෙහි නියමිත ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කිරීම
- ශ්ලෝක නිවැරදි ව ලිවීම සහ මතකයෙන් කීම

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 1
- චාණක්‍යශතකය හා වෙනත් ශතකකාව්‍ය
- සංස්කෘත පාඨමාලාව 4
- 4cm X 8cm කාඩ්පත්

## ගුරුවරයාගේ පරිශීලනය සඳහා

- ගීතකෞමදී (සංයුක්ත තැටිය) පූජ්‍ය උඩවෙල රේවත හිමි
- සංස්කෘත ශතක සාහිත්‍ය - මහාචාර්ය ජයදේව තිලකසිරි

**ඇමුණුම 1**

පණ්ඩිතෙ ච ගුණාඃ සර්වෙ මූර්ඛෙ දොෂා හි කෙවලම්

තස්මාන් මූර්ඛසහස්‍රෙෂු ප්‍රාඥ එකො විශිෂ්‍යතෙ (04 චා.ශ)

රූපයෞවනසම්පන්නා විශාලකුලසම්භවාඃ

විද්‍යාහීනා න ශොභන්තේ නිර්ගන්ධා ඉව කිංශුකාඃ (07 චා.ශ)

ලාලයෙත් පඤ්චවර්ෂාණි දශවර්ෂාණි තාඩයෙත්

ප්‍රාප්තෙ තු ෂොඩශෙ වර්ෂෙ පුත්‍රං මිත්‍රවදාචරෙත් (11 චා.ශ)

ලාලනෙ බහවො දොෂාස්තාඩනේ බහවො ගුණාඃ

තස්මාත් පුත්‍රඤ්ච ශිෂ්‍යං ච තාඩයෙත් න තු ලාලයෙත් (12 චා.ශ)

එකෙනා’පි සුවෘක්ෂෙණ පුෂ්පිතෙන සුගන්ධිනා

වාසිතං තද්වනං සර්වං සුපුත්‍රෙණ කුලං යථා (13 චා.ශ)

උත්සවෙ ව්‍යසනෙ චෛව දුර්භික්ෂෙ ශත්‍රුවිග්‍රහෙ

රාජද්වාරෙ ශ්මශානෙ ච යස්තිෂ්ඨති ස බන්ධවඃ (17 චා.ශ)

න විශ්වසෙදවිශ්වස්තං මිත්‍රඤ්චාපි න විශ්වසෙත්

කදාචිත් කුපිතං මිත්‍රං සර්වදොෂං ප්‍රකාශයෙත් (20 චා.ශ)

# පාඩම 14 - පඤ්චතන්ත්‍රය

**නිපුණතාව** : 10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රස විඳියි.

**නිපුණතා මට්ටම** : 10.1 සංස්කෘත පාඨමාලා 04 ග්‍රන්ථය ඇසුරින් පඤ්චතන්ත්‍රය රසවිඳියි.

**කාලච්ඡේද** : 25 යි.

**ඉගෙනුම් පල** :

- පඤ්චතන්ත්‍රයේ කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- පඤ්චතන්ත්‍රයේ කථා මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.
- පඤ්චතන්ත්‍රයේ කථා රසවිඳියි.
- පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.
- පඤ්චතන්ත්‍රයේ ශ්ලෝක රසවිඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- පඤ්චතන්ත්‍රය සිසුන්ට පෙන්වා එහි ග්‍රන්ථනාමය සිසුන් ලවා කියවන්න.
- පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථාවක සිතුවමක් පන්තියෙහි සිසුන්ට ප්‍රදර්ශනය වන අයුරින් රඳවා තබන්න.
- එම පින්තූරයෙන් මතු කෙරෙන කථාව සිසුන් ලවා කියවන්න.
- චිත්‍රය බලා එම කථාව පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

**පාඩම සංවර්ධනය:**

**පියවර 1**

- පඤ්චතන්ත්‍රයේ තන්ත්‍ර පහක් ඇති බව සඳහන් කරන්න.
- පඤ්චතන්ත්‍රයේ උපදේශාත්මක රසවත් කථා රාශියක් ඇතුළත් වන බව පැහැදිලි කරන්න.
- සිසුන් දන්නා ඕනෑ ම උපදේශාත්මක කථාවක් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පඤ්චතන්ත්‍රයේ පහත සඳහන් කථා වෙනුවෙන් කාලච්ඡේද 2 බැගින් වෙන් කර ගන්න.
    - 01 - කීලෝත්පාටීව වානරඃ කථා
    - 02 - බකකර්ටක කථා
    - 14 - මත්ස්‍යත්‍රය කථා

- 17 - සුබීමුඛවානරයූථ කථා
- 18 - වානර - චටකදම්පති කථා
- 19 - ධර්මබුද්ධි - පාපබුද්ධි කථා
- 22 - නෘපසේවක වානර කථා

- සිසුන්ට එම කථා ඇතුළත් සංස්කෘත පාඨමාලා 4 ග්‍රන්ථය ලබාදෙන්න.
- අදාළ දිනයට නියමිත කථාව කොටසින් කොටස හඬ නගා කියවීමට සිසුන් මෙහෙයවන්න.
- නිවැරදි ව උච්චාරණය කිරීම අර්ථය වටහා ගැනීමට පහසුවන බව සිසුන්ට අවධාරණය කරන්න.
- අර්ථාවබෝධයෙන් තොර ව කියැවීම ඵල රහිත බව සිසුන්ට පෙන්වා දෙන්න.
- මාධ්‍යභාෂාවට පරිවර්තනය කොට නිවැරදි ව අර්ථාවබෝධයක් ලබාගැනීමේ අගය සහ එය පුද්ගල සංවර්ධනයට හේතුවන ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් පවත්වන්න.
- ජීවිතය සකස් කොට ගැනීම සඳහා පඤ්චතන්ත්‍රයෙන් ලැබෙන පිටිවහල අගය කරමින් ක්ෂණික කථාවක් කිරීමට කැමති ශිෂ්‍යයකුට අවස්ථාව ලබාදෙන්න.
- පහසුකම් තිබේ නම් අන්තර්ජාලයෙන් ලබාගත් අදාළ කථාවේ වීඩියෝ දර්ශනයක් නැරඹීමට සිසුන්ට ඉඩ සලසන්න.

## පියවර 2

- පඤ්චතන්ත්‍රයේ පහත සඳහන් ශ්ලෝක වෙනුවෙන් සුදුසු පරිදි කාලච්ඡේද 10 ක් යොදා ගන්න.

  3, 5, 7, 19, 76, 78, 111, 114, 118, 130, 139, 145, 148, 149, 159, 174, 176, 188, 210, 211, 212, 213, 225, 260, 280, 288, 395, 425, 426, 427
- සිසුන්ට සංස්කෘත පාඨමාලා 4 ලබා දී නියමිත දිනයට යොදා ගත් ශ්ලෝක කෙරෙහි අවධානය යොමු කරවන්න.
- අදාළ කථාවල ශ්ලෝක පන්තිය දෙපිළකට බෙදා මාරුවෙන් මාරුවට සජ්ඣායනා කරමින් රස විඳීමට අවස්ථාව දෙන්න.
- එම ශ්ලෝකයන්හි සරල අර්ථය ඉස්මතු කොට පෙන්වා දෙන්න.
- පළමු ව ශ්ලෝකය කියවා අවබෝධ කරගත යුතු බවත් මාධ්‍යභාෂාවට නැගිය යුත්තේ ඉන් අනතුරුව බවත් සිසුන්ට පහදන්න.
- උපදේශාත්මක ශ්ලෝක වාචෝද්ගත කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසුන්ගේ ද අදහස් විමසමින් එම ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරමින් අර්ථය සාකච්ඡා කරන්න.
- ඒ ඒ දිනයට අදාළ ශ්ලෝක තුළින් ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරමින් සියලු ම ශ්ලෝක සාකච්ඡා කර අවසන් වූ පසු දළ සටහන්වලින් ඒවා පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පඤ්චතන්ත්‍රයෙහි කොටස් 5 නිවැරදි ව නම් කිරීම
- පඤ්චතන්ත්‍රයෙහි ඇතුළත් කථා රසවත් ව ඉදිරිපත් කිරීම
- පඤ්චතන්ත්‍රයෙහි කථාවලින් නිරූපිත උපදේශ අර්ථාවබෝධයෙන් යුතු ව මතුකොට දැක්වීම
- දේවනාගරී අක්ෂරවලින් දැක්වෙන කථා නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නගා කියවීම
- පඤ්චතන්ත්‍රයෙහි ශ්ලෝක රිද්මයානුකූල ව සජ්ඣායනා කිරීම
- පඤ්චතන්ත්‍රයෙහි උපදේශාත්මක ශ්ලෝක වාචෝද්ගත කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- පඤ්චතන්ත්‍රයෙහි තෝරා ගනු ලබන කථාවේ සිතුවමක් සහිත පෝස්ටරයක් (හෝ පොතෙහි ඇති සිතුවමක්)
- පඤ්චතන්ත්‍රය
- සංස්කෘත පාඨමාලා 4

**ඇමුණුම 1**

03. (අ) පහත සඳහන් මාතෘකා අතුරින් **එකකට** ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

(i) '**දෛවය පරදී - උත්සාහය ජයගනී.**' පඤ්චතන්ත්‍රයේ **මසුන් තිදෙනකුගේ** කථාව ඇසුරින් විමර්ශනය කරන්න.

(ii) '**තමන්ට අයිති නොවන ක්‍රියාවන්හි නියැළීමට යාම විනාශයට හේතුව ය.**' කීලෝත්පාටිවානර කථාව ඇසුරෙන් විමර්ශනය කරන්න.

(iii) චාණක්‍ය පඬිවරයාගේ **ජීවිතාවබෝධය** චාණක්‍යශතකයෙන් පිළිබිඹු වෙයි. ඇගයීමක් කරන්න.

(iv) චාණක්‍යශතකයෙන් හෙළිවන **ජීවිතෝපදේශ** පිළිබඳ ඇගයීමක් කරන්න.

(ආ) මෙම ප්‍රකාශනවල අදහසට අනුව වාක්‍ය 04ක් ලියන්න.

- अर्धो घटो घोषमुपैति नूनम् ।
- उदारचरितानां तु वसुधैव कुटुम्बकम् ।
- उद्यमेन हि सिद्यन्ति कार्याणि न मनोरथैः ।
- उपदेशो हि मूर्खाणां प्रकोपाय न शान्तये ।
- दुर्लभः स गुरुर्लोके शिष्यचित्तापहारकाः ।

# ඇගයීම හා තක්සේරුකරණය

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබ ගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එ සේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එ ලෙස තම සිසුන් ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන් ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන් ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයා ගේ කාර්යභාරය යි. ඇගයීමේ(තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed Forward) යනුවෙනි. සිසුන් ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වුයේ ද යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමය යි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

| | | | |
|---|---|---|---|
| 1. | පැවරුම් | 2. | ව්‍යාපෘති |
| 3. | සමීක්ෂණ | 4. | ගවේෂණ |
| 5. | නිරීක්ෂණ | 6. | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 7. | ක්ෂේත්‍ර චාරිකා | 8. | කෙටි ලිඛිත පරීක්ෂණ |
| 9. | ව්‍යුහගත රචනා | 10. | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. | ශ්‍රවණ පරීක්ෂණ |
| 13. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. | කථනය |
| 15. | ස්වනිර්මාණ | 16. | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. | සංකල්ප සිතියම | 18. | ද්විත්ව සටහන් ජර්නල |
| 19. | බිත්ති පුවත්පත් | 20. | ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් |
| 21. | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. | විවාද |
| 23. | සාකච්ඡා මණ්ඩල | 24. | සම්මන්ත්‍රණ |
| 25. | ක්ෂණික කථා | 26. | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක් මත්, සෑම විෂයක් සම්බන්ධයෙන් මත්, සෑම විෂය ඒකකයකට මත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය ඃ- පළමු වාරය
2. ආධාරක අංකය ඃ- 01
3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ- 8.1
4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ- 8.1 සංස්කෘත භාෂාව නිවැරැදි ව හසුරුවමින් පූර්ණ වාක්‍ය ගොඩනැඟීම
5. ආධාරකයේ ස්වභාවය ඃ- කතා පොතක් නිර්මාණය
6. ආධාරකයේ අරමුණු ඃ-

- වරනැඟීම් පිළිබඳ අර්ථාවබෝධය ලබා දීම
- නිර්මාණශීලී වාක්‍ය ලිවීම දිරි ගැන්වීම
- භාෂා කුසලතාව ප්‍රායෝගික ජීවිතයට අර්ථාන්විත ව යොදා ගැනීම

7.ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් ඃ-

- එක් එක් සිසු කණ්ඩායමට වෙන වෙන ම දේවනාගරී අක්ෂර යොදා ගනිමින් අවුරුදු 10ක ළමයකුට ගැළැපෙන ආදර්ශමත් කතාවක් ලිවීමට නිශ්චිත කාලයක් ලබා දෙන්න.
- සිසුන් ලියන ලද කතා පරීක්ෂා කර වැරැදි ඇතොත් නිවැරැදි කොට තව දුරටත් සංවර්ධනය කරන්න.
- කතාවේ අන්තර්ගතය A4 පිටු 8කට සීමා කිරීමට, අකුරුවල විශාලත්වය 20(font size) හි පවත්වා ගැනීමට, පින්තූර, කවරය සහ පොතක තිබිය යුතු අනෙකුත් අංගෝපාංග සිසු අභිමතය පරිදි චිත්තාකර්ෂණීය ලෙස සැකැසීමට උපදෙස් දෙන්න.
- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් ඃ-

- කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් සිත් ඇද ගන්නාසුලු, ළමයින්ට ගැළපෙන සරල කතාවක් ගොඩනගන්න.
- පොතෙහි විවිධ කාර්යවල නියැළුණු කණ්ඩායමේ සියලු සිසුන් ගේ නම් ද ඇතුළත් කරමින් පොත ලියා පරිගණක යතුරු ලියනය (පහසුකම් ඇතොත්) කරන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් මට්ටමින් පොත නිර්මාණය කරන්න.

ලකුණු පරාසය

- ඉතා හොඳ යි. 04
- හොඳ යි. 03
- මධ්‍යස්ථ යි. 02
- සංවර්ධනය විය යුතු යි. 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

9-10 විශිෂ්ට මට්ටමේ නිපුණතාව

| | නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| 1. | ඵලදායී ළමා කතාවක් වීම | | | | | | | | | |
| 2. | වාක්‍ය නිවැරැදි බව | | | | | | | | | |
| 3. | නියමිත පිටු ගණන | | | | | | | | | |
| 4. | පොතට අවශ්‍ය අංග | | | | | | | | | |
| 5. | සුන්දර නිමාව | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | |

| | |
|---|---|
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට අඩු | නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.

| | |
|---|---|
| | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018** |
| | **Primary Piriven Mid Year Term Test - 2018** |
| | 4 ශ්‍රේණිය/**Grade 4** |
| | **සංස්කෘත භාෂාව** කාලය : පැය දෙකයි |
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | Sanskrit **විභාග අංකය :**.......................................... Time : Two hours |

- **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසේ 02, 03 ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

**01. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. දීර්ඝස්වර පමණක් ඇතුළත් වරණය මින් කුමක් ද?
   - (1) **अ इ उ ऋ ।**
   - (2) **आ ई ऊ ॠ ।**
   - (3) **ए ल ओ औ ।**
   - (4) **अ आ इ ई ।**

2. වර්ගාන්තාක්ෂර සංඛ්‍යාව වන්නේ,
   - (1) දෙකකි.
   - (2) තුනකි.
   - (3) හතරකි.
   - (4) පහකි.

3. අන්තඃස්ථාක්ෂර පමණක් ඇති වරණය වන්නේ,
   - (1) **य र ल व ।**
   - (2) **य र ल ह ।**
   - (3) **श ष स ह ।**
   - (4) **य व र स ।**

4. 'හල' ප්‍රත්‍යාහාරයෙහි අකුරු ගණන වන්නේ,
   - (1) දෙකකි.
   - (2) තුනකි.
   - (3) සතරකි.
   - (4) පහකි.

5. **मुनयः** යන නාමපදය අයත් විභක්තිය කුමක් ද?
   - (1) **द्वितीया ।**
   - (2) **प्रथमा ।**
   - (3) **तृतीया ।**
   - (4) **चतुर्थी ।**

6. **इ** කාරාන්ත නාමපද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   - (1) **अज - गज - अनुज ।**
   - (2) **गुरु - भानु - साधु ।**
   - (3) **पितृ - भ्रातृ - शास्तृ ।**
   - (4) **मुनि - कपि - रवि ।**

7. **बालकः** යන්නෙහි බහුවචන රූපය වන්නේ,

(1) **हे बालक ।** (2) **बालकौ ।**

(3) **बालकाः ।** (4) **बालकान् ।**

8. **कुमारस्य - देवेन** මෙම පදවල සිංහල තේරුම පිළිවෙළට අයත් වරණය කුමක් ද?

(1) දෙවියා විසින් - කුමාරයාට (2) කුමාරයාගේ - දෙවියාගේ

(3) කුමාරයාගේ - දෙවියා විසින් (4) කුමාරයාට - දෙවියාගේ

9. **अनमत् ।** යන පදය අයත් ලකාරය වන්නේ,

(1) **लङ् ।** (2) **लोट् ।** (3) **लट् ।** (4) **लृट्**

10. **पठन्ति ।** යන පදයේ නිවැරදි තේරුම වන්නේ,

(1) **දෙදෙන පාඩම් කරත්**, යන්නයි. (2) **පාඩම් කරති**, යන්නයි.

(3) **පාඩම් කරයි**, යන්නයි. (4) **පාඩම් කරමු**, යන්නයි.

11. **वाग्विद्या ।** යන්නෙහි නිවැරදි විසන්ධිපදය වන්නේ,

(1) **वाग्** + **विद्या ।** (2) **वाद्** + **विद्या ।**

(3) **वाक्** + **विद्या ।** (4) **वाक्** + **विद्य ।**

12. **कन्या** + **आभरण ।** යන්නෙහි සන්ධිපදය වන්නේ,

(1) **कन्यभरण** (2) **कन्याभरण**

(3) **कन्याआभरण** (4) **कन्यैभरण**

13. **देवलोकः** යන්න අයත් සමාසය වන්නේ,

(1) **तत्पुरुषसमास ।** (2) **द्विगुसमास ।**

(3) **कर्मधारयसमास** (4) **बहुव्रीहिसमास ।**

14. විෂ්ණුශර්මන් පඬිවරයා විසින් රචිත කෘතිය මින් කුමක් ද?

(1) **हितोपदेशः ।** (2) **पञ्चतन्त्रम् ।**

(3) **मनुस्मृतिः ।** (4) **बृहत्कथा ।**

15. හිතෝපදේශයේ පරිච්ඡේද සංඛ්‍යාව වන්නේ,

(1) සතරකි. (2) පහකි. (3) සයකි. (4) සතකි.

16. 'මහිලාරෝප්‍ය' නුවර රජ කළ රජතුමා මොවුන් අතුරින් කවු ද?

(1) अनन्तशक्ति। (2) बहुशक्ति। (3) उग्रशक्ति। (4) अमरशक्ति।

17. 'චාණක්‍ය' පඬිවරයා විසින් රචිත ශතකකාව්‍යය මින් කුමක් ද?

(1) नीतिशतकम्
(2) अमरुशतकम्।
(3) चाणक्यशतकम्।
(4) भक्तिशतकम्।

18. පඤ්චතන්ත්‍රයේ එන සිංහයා සහ ගවයා හඳුන්වන නම් වන්නේ,

(1) करटक - दमनक।
(2) दन्तिल - गोरम्ब।
(3) देवशर्म - दुर्दान्त।
(4) पिङ्गलक - संजीवक।

19. 'බක-කර්කටකකථා' අයත් වන්නේ පඤ්චතන්ත්‍රයේ කුමන තන්ත්‍රයට ද?

(1) अपरीक्षितकारक।
(2) मित्रभेद।
(3) ककोलुकीय।
(4) मित्रलाभ

20. හිතෝපදේශයේ අතුරු කථා සංඛ්‍යාව වන්නේ,

(1) තිස් අටකි.
(2) හතළිස් අටකි.
(3) පනස් අටකි.
(4) හැට අටකි.

(ලකුණු 2 x 20 = 40 යි)

## II කොටස

**02. (අ) පහත සඳහන් ගද්‍ය-පද්‍ය පාඨ සිංහලයට නඟන්න.**

अथ कदाचित्तत्रानुषङ्गिकं वानरयूथमितश्चेतश्च परिभ्रमदागतम्। तत्रैकस्य कस्यचिच्छिल्पिनोऽर्धस्फाटितोऽञ्जनवृक्षदारुमयः स्तम्भः खदिरकीलकेन मध्यनिहितेन तिष्ठति। एतस्मिन्नन्तरे ते वानरास्तरुशिखरप्रासादश्रुङ्गदारुपर्यन्तेषु यथेच्छया क्रीडितुमारब्धाः।

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

(ලකුණු 03 යි)

स आह वत्स, सत्यमुपलक्षितं भवता। मया हि मत्स्यादनं प्रति परमवैराग्यतया सांप्रतं प्रायोपवेशनं कृतम्। तेनाहं समीपगतानपि मत्स्यान्न भक्षयामि।

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 03 යි)

**(ආ) පහත සඳහන් පද්‍යපාඨ සිංහලට නගන්න.**

इह लोके हि धनिनां परोऽपि स्वजनायते।
स्वजनोऽपि दरिद्राणां सर्वदा दुर्जनायते॥

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 03 යි)

लालयेत् पञ्चवर्षाणि दशवर्षाणि ताडयेत्।
प्राप्ते तु षोडशे वर्षे पुत्रं मित्रवदाचरेत्॥

.....................................................................................................................

.....................................................................................................................

(ලකුණු 03 යි)

**03. (අ) පහත සඳහන් මාතෘකා අතුරින් එකකට ප්‍රමාණවත් විවරණයක් සපයන්න.**

(i) **'තමන්ට අයිති නොවන ක්‍රියාවන්හි නියැළීමට යාම විනාශයට හේතුවේ.'** කීලෝත්පාටීවානර කථාව ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ii) චාණක්‍යශතකයෙන් හෙළිවන **ජීවිතෝපදේශ** පිළිබඳ ඇගයීමක් කරන්න.

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.....................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(ලකුණු 08 යි)

(ආ) **अर्धो घटो घोषमुपैति नूनम् ।** මෙම ප්‍රකාශනයෙහි අදහසට අනුව වාක්‍ය 04ක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(ලකුණු 04 යි)

04. (අ) **चप** ප්‍රත්‍යාහාරයට අයත් අක්ෂර ලියන්න.

.............................................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් සූත්‍රවල තේරුම ලියන්න.

१. **इचुयशानां तालु ।** ......................................................................................

२. **अरेदो नामिनो गुणाः ।** ......................................................................................

(ලකුණු 2 x 2 = 04 යි)

(ඇ) පහත සඳහන් සිංහල වචන **දේවනාගරී සංයුක්තාක්ෂරවලින්** ලියන්න.

I. දුර්භික්ෂ ..............................................................................................

II. ස්ථාපනීයම් ..............................................................................................

III. ඉතස්තතඃ ..............................................................................................

VI. විශ්වසන්ති ..............................................................................................

V. විශ්වබන්ධුත්වං ..............................................................................................

IV. උක්තවාන් ..............................................................................................

(ලකුණු 1 x 6 = 06 යි)

05. (අ) **वनिता** හා **वृक्ष** යන නාමපද අයත් ලිංග නම් කරන්න.

..............................................................................................

(ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| शब्द | विभक्ति | සිංහල අර්ථය |
|---|---|---|
| जनकान् | | |
| गुरुभिः | | |

(ලකුණු 1 x 4 = 04 යි)

(ඇ) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| आख्यातपद | लकार | वचन | සිංහල අර්ථය |
|---|---|---|---|
| वदन्ति | | बहुवचन | |
| अधावत् | लङ् | | |
| लिखतु | | | ලියාවා! |

(ලකුණු 1 x 6 = 06 යි)

06. (අ) **मे महदपि राज्यं न सौख्यमावहति ।** මෙහි ඇති සන්ධිපද දෙක තෝරා ලියන්න.

..............................................................................................

(ලකුණු 02 යි)

(ආ) ස්වර සන්ධියේ ප්‍රභේද 04ක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

(ලකුණු 04 යි)

(ඇ) පහත සඳහන් පද යොදා සුදුසු පරිදි වගුව පුරවන්න.

( **प्रतिवाचम्** / **श्रामणेरः** / **पठितुम्** / **गौतमः** / **रामलक्ष्मणौ** / **नायकः** )

| समास | तद्धित | कृदन्त |
|---|---|---|
| | | |

(ලකුණු 1 x 6 = 06 යි)

**07.** (අ) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

( **सा** - **बहिः** - **तेन** - **पञ्जरे** - **स्वशाबकं** - **तस्य** - **तं** )

**अथैकः शुकः ................... बद्धस्तिष्ठति। पञ्जरात् ............... शाखायां स्थिता शुकी ................ माता। सा ...................... बद्धमवलोक्याश्रु मुञ्चन्ती .................. सह भाषते। सा ................ किं वदतीति किं जानासि? ...................... तं वदति।**

(ලකුණු 1 x 7 = 07යි)

(ආ) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

मूढानां चेष्टितानि प्रायेण विनोदावहानि। यथा हि एकदा दशमूढाः देशाटनाय प्रस्थिताः। किञ्चिद्दूरं गतानां तेषामुपस्थिता काचिदगाधा नदी। बाहुभ्यां तरन्तस्ते कथमपि नदीं तीर्त्वा पारं गताः। आसीत् तेषां मध्ये कश्चन वृद्धः। स किं सर्वे तीरमनुप्राप्ताः इति जिज्ञासमानस्तान् एकैकशो गणयामास। परं नैव परिगणितास्तेन। ततः स आक्रोशत्।

(1) මෙහි මෝඩයෝ කී දෙනෙක් සිටිත් ද?

..............................................................................................................................

(2) ඔවුහු කුමක් පිණිස පිටත් ව ගියාහු ද?

..............................................................................................................................

(3) ටික දුරක් ගියා වූ ඔවුන්හට මුණගැසුණේ කුමක් ද?

..............................................................................................................................

(4) ඔවුන් අතරේ සිටි මහල්ලා කළේ කුමක් ද?

..............................................................................................................................

(5) **काचिदगाधा** යන්නෙහි විසන්ධිය කුමක් ද?

..............................................................................................................................

(ලකුණු 1 x 5 = 05යි)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018**<br>**Primary Piriven Year End Test - 2018**<br>4 ශ්‍රේණිය /**Grade 4**<br>**සංස්කෘත භාෂාව** Sanskrit **විභාග අංකය :**.......................................... **කාලය : පැය දෙකයි** Time : Two hours |

♦ **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසේ 02, 03 ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

**01. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. එක් මාත්‍රාවක් තුළ උච්චාරණය වන අකුරු පමණක් ඇති වරණය වන්නේ,
   (1) **अ ई ऊ ग ।** (2) **ए ऐ आ ॠ ।**
   (3) **इ अ उ ऋ ।** (4) **क अॅ ॠ ।**

2. ස්පර්ශාක්ෂර සංඛ්‍යාව වන්නේ,
   (1) **२५** (2) **३०** (3) **४०** (4) **५९**

3. **आ ऐ औ आर् आल्** යන අකුරු පහ හඳුන්වන පොදු නාමය වන්නේ,
   (1) ගුණ යන්න යි. (2) සන්ධ්‍යක්ෂර යන්න යි.
   (3) දීර්ඝ යන්න යි. (4) වෘද්ධි යන්න යි.

4. **'එකුන්විස්ස'** නාගරී ඉලක්කමෙන් ඇති වරණය වන්නේ,
   (1) **१९** (2) **२०** (3) **२१** (4) **२२**

5. **मरुते** යන නාමපදය අයත් විභක්තිය කුමක් ද?
   (1) **सप्तमी ।** (2) **प्रथमा ।** (3) **तृतीया ।** (4) **चतुर्थी ।**

6. ස්ත්‍රීලිංග නාමපද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) **गङ्गा- वधू - शाला ।** (2) **नदी - गो - बुद्धि ।**
   (3) **वनिता - शाला - साधु ।** (4) **स्त्री - यवलू - वधू ।**

7. **पुस्तकानाम्** යන්නෙහි ද්විවචන රූපය වන්නේ,

(1) **पुस्तकौ ।** (2) **पुस्तके ।**

(3) **पुस्तकाभ्याम् ।** (4) **पुस्तकयोः ।**

8. 'අයියලා විසින්' යන්නෙහි නිවැරදි සංස්කෘත පරිවර්තනය වන්නේ,

(1) **अग्रजेन ।** (2) **अग्रजैः ।** (3) **अग्रजेभ्यः ।** (4) **अग्रजान् ।**

9. **लृट्** (ලෘට්) ලකාරයට අයත් ආඛ්‍යාතපදය මින් කුමක් ද?

(1) **मुष्णाति ।** (2) **क्षाम्यन्ति ।** (3) **भूषिष्यामि ।** (4) **अस्यसि ।**

10. 'කළේ ය' යන්නෙහි නිවැරදි ආඛ්‍යාත රූපය වන්නේ,

(1) **अकरोत् ।** (2) **करोति ।** (3) **करिष्यति ।** (4) **करोतु ।**

11. **तदेव ।** යන්නෙහි නිවැරදි විසන්ධිපදය වන්නේ,

(1) **तद् + एव ।** (2) **तथा + एव ।** (3) **तं + एव ।** (4) **तत् + एव ।**

12. **भवान् + तनोति ।** යන්නෙහි සන්ධිපදය වන්නේ,

(1) **भवान्तनोति ।** (2) **भवतनोति ।**

(3) **भावतनोति ।** (4) **भवांस्तनोति ।**

13. **नयनयोः आनन्दः ।** යන විග්‍රහවාක්‍යයෙන් සෑදෙන නිවැරදි සමාසපදය තෝරන්න.

(1) **नयननन्दः ।** (2) **नयनानन्दः ।**

(3) **नयनयोनन्दः ।** (4) **आनन्दनयनः ।**

14. **धनिकः** යනපදය අයත් වන්නේ මින් කුමන තද්ධිතයට ද?

(1) **भावतद्धित ।** (2) **समूहार्थतद्धित ।**

(3) **अस्त्यर्थतद्धित ।** (4) **अनेकार्थतद्धित ।**

15. ත්‍රෛකාලික කෘදන්තප්‍රත්‍යය සංඛ්‍යා ගණන

(1) විස්සකි. (2) විසිදෙකකි.

(3) විසිහතරකි. (4) විසිහයකි.

16. **तथा किमर्थं वदति।** යන වාක්‍යයෙහි නිවැරදි සිංහල තේරුම වන්නේ,

(1) ඇයි එහෙම කියන්නේ ? (2) එසේ කුමක් කියයි ද?

(3) කුමන අර්ථයක් පවසයි ද? (4) ඇයි අර්ථයක් ම නොකියන්නෙ?

17. 'කාව්‍යාදර්ශයේ කතුවරයා' මොවුන් අතුරෙන් කවු ද?

(1) අශ්වඝෝෂ හිමි (2) කාලිදාස

(3) භාරවී (4) දණ්ඩින්

18. කුමාරදාස කවියා විසින් රචිත මහාකාව්‍යය වන්නේ,

(1) **सौन्दरनन्दमहाकाव्यम्।** (2) **रघुवंशमहाकाव्यम्।**

(3) **शिशुपालवधमहाकाव्यम्।** (4) **जानकीहरणमहाकाव्यम्।**

19. අමරශක්ති රජුගේ පුතුන් තිදෙනාට ධර්මශාස්ත්‍ර හා නීතිශාස්ත්‍ර ඉගැන්වීම සඳහා විෂ්ණුශර්මන් පඬිවරයාට ගත වූ මාස ගණන කෙතෙක් ද?

(1) මාස දෙකකි. (2) මාස හයකි. (3) මාස අටකි. (4) මාස දහයකි.

20. හිතෝපදේශයේ පද්‍ය සංඛ්‍යාව ගණනින්,

(1) **५५९** (2) **६२०** (3) **७५२** (4) **७५९**

(ලකුණු 2 x 20 = 40 යි)

**02. (අ) පහත සඳහන් ගද්‍ය-පද්‍ය පාඨ සිංහලයට නගන්න.**

**भद्रे किं मां यद्भविष्यसदृशं संभावयसि ? तत्पश्य मे बुद्धिप्रभावं यावदेनं दुष्टसमुद्रं स्वचञ्च्वा शोषयामि। टिट्टिभ्याह अहो कस्ते समुद्रेण सह विग्रहः।**

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

(ලකුණු 03 යි)

भोः सर्वे मूर्खा यूयम्। नैते वह्निकणाः गुञ्जाफलानि एतानि। तत्किं वृथा श्रमेण।
नैतस्माच्छीतरक्षा भविष्यति। तदन्विष्यतां कश्चिन्निर्वातो वनप्रदेशो गुहा वा गिरिकन्दरं वा।

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 03 යි)

(ආ) පහත සඳහන් පද්‍යපාඨ **සිංහලට** නගන්න.

पूर्वे वयसि यः शान्तः स शान्त इति मे मतिः।
धातुषु क्षीयमाणेषु शमः कस्य न जायते॥

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 03 යි)

कोकिलानां स्वरो रूपं नारिरूपं पतिव्रता।
विद्या रूपं कुरूपाणां क्षमा रूपं तपस्विनाम्॥

..............................................................................................................................

..............................................................................................................................

(ලකුණු 03 යි)

03. (අ) පහත සඳහන් මාතෘකා අතුරින් **එකකට** ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

(i) **'දෛවය පරදී - උත්සාහය ජයගනී.'** පඤ්චතන්ත්‍රයේ **මසුන් තිදෙනකුගේ** කථාව ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ii) 'චාණක්‍ය පඬිවරයාගේ **ජීවිතාවබෝධය** චාණක්‍යශතකයෙන් පිළිබිඹු වෙයි' ඇගයීමක් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 08 යි)

(ආ) **उदारचरितानां तु वसुधैव कुटुम्बकम् ।** මෙම ප්‍රකාශනයෙහි අදහසට අනුව **වාක්‍ය 04ක්** ලියන්න.

.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 04 යි)

**04.** (අ) **ह ल इ छ ग झ ठ** යන අකුරු අතුරින් **අඝෝෂාක්ෂර** තෝරා ලියන්න.

..............................................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) **ක්ත්‍ර, ද්ම, ශ්‍ර, ක්ත** යන අකුරු **විශේෂ රූප ගන්නා සංස්කෘත** සංයුක්තාක්ෂරවලින් ලියන්න.

(1) ................................................ (2) ................................................

(3) ................................................ (4) ................................................

(ලකුණු 2 x 2 = 04 යි)

(ඇ) පහත සඳහන් සූත්‍රවල තේරුම ලියන්න.

**१. ञमे ञमा वा ।** ..............................................................................................

**२. कादयो मावसानाः स्पर्शाः ।** ..............................................................................................

**३. ऋटुरषाणां मूर्धाः ।** ..............................................................................................

(ලකුණු 1 x 6 = 06 යි)

05. (අ) **पुष्पे** හා **साधुभ्याम्** යන නාමපදවල **නාමමූලය** ලියන්න.

..........................................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| शब्द | विभक्ति | සිංහල අර්ථය |
|---|---|---|
| वनितायाम् | | |
| दण्डिना | | |

(ලකුණු 1 x 4 = 04 යි)

(ඇ) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| आख्यातपद | लकार | वचन | සිංහල අර්ථය |
|---|---|---|---|
| वपते | लट् | | |
| नय | | एकवचन | |
| पठिष्यति | | | හදාරන්නේ ය |

(ලකුණු 1 x 6 = 06 යි)

06. (අ) **स्वामिना यद्यवज्ञा क्रियते तदप्ययुक्तम्।** මෙහි ඇති **සන්ධිපද** දෙකක් තෝරා ලියන්න.

..........................................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) **अजन्त** / **मुनीन्द्रः** / **भवांस्तत्र** / **कोऽर्थः** යන **සන්ධිපද විසන්ධි** කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 04 යි)

(ඇ) පහත සඳහන් පද යොදා සුදුසු පරිදි වගුව පුරවන්න.

( जनता / नर्तन / उपगुरु / वादिन् / भौम / नरकपतितः )

| समास | तद्धित | कृदन्त |
|---|---|---|
| | | |

(ලකුණු 1 x 6 = 06 යි)

07. (අ) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

(वृद्धिं - तदा - स - कस्यापि - कालेन - यथा यथा - तस्य )

कश्चित् बालकः पाठशालायां .................... सहध्यायिनः पुस्तकमचोरयत्।
तत् ..................गृहमानीय मातुर्हस्तेऽर्पितवान्। तया सह ..........................
तीव्रं दण्डनीय आसीत्। तदकृत्वा सा ................ कृत्यमभिनन्द्य तस्मै आम्रफलमेकं
भक्षणार्थमयच्छत्। गच्छति काले..................... सेऽवर्धत तथा तथा तस्य
स्तेयबुद्धिरपि .................. गता। किं बहुना .................. स महांश्चोरः संवृत्तः।

(ලකුණු 1 x 7 = 07යි)

(ආ) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

कश्चन मूर्खः कदाचित् ग्रामान्तरात् प्रतिनिवर्तमानो निजग्रामगामिनं पन्थानं व्यस्मरत्। अथ पन्थानं पृच्छन्तं तं मूर्खजनाः नदीतटे दृश्यमानस्य तरोरुपरि वर्त्मना गच्छ इत्यवोचन्। ततः स तरुमुपगम्य एतस्योपरि खलु मे पन्था जनैरुपदिष्टः इति मत्वा तस्य तरोः पृष्ठमारोहत्। तस्य पृष्ठे सर्पतस्तस्य भारात् तरोः शाखा ननाम। स तां यत्नेनावलम्ब्य यावदतिष्ठत् तावत् कश्चिदाधोरणः गजोपरि स्थितः नद्या आरुह्य तेन पथा समाययौ।

(1) මෙහි එන මෝඩයා සිහි කළේ කුමක් ද?

.............................................................................................................................

(2) මිනිස්සු ඔහුට මාර්ගය පෙන්වූයේ කෙසේ ද?

.......................................................................................................................................................

(3) ගස සමීපයට පැමිණි හෙතෙම කළේ කුමක් ද?

.......................................................................................................................................................

(4) ඉහත ඡේදයේ ඇති පූර්වක්‍රියාවක් ලියන්න.

.......................................................................................................................................................

(5) **आघोरणः** යනුවෙන් හැඳින්වූයේ කවු ද?

.......................................................................................................................................................

(ලකුණු 1 x 5 = 05යි)